# 10 ශ්‍රේණිය

# බුද්ධ ධර්මය

## ගුරු මාර්ගෝපදේශය

(2015 සිට ක්‍රියාත්මක වේ )

ආගම් හා සාරධර්ම අධ්‍යාපන දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය
මහරගම
ශ්‍රී ලංකාව

www.nie.lk

# බුද්ධ ධර්මය

## ගුරු මාර්ගෝපදේශය

## 10 ශ්‍රේණිය

**(2015 වර්ෂයේ සිට ක්‍රියාත්මක වේ.)**


**ආගම් හා සාරධර්ම අධ්‍යාපන දෙපාර්තමේන්තුව**

**ජාතික අධ්‍යාපන ආයතනය**

**මහරගම**

**ශ්‍රී ලංකාව**



වෙබ් අඩවිය : www.nie.lk

විද්‍යුත් තැපැල : info@nie.lk

බුද්ධ ධර්මය

10 ශ්‍රේණිය

ගුරු මාර්ගෝපදේශය

ප්‍රථම මුද්‍රණය 2015

C ජාතික අධ්‍යාපන ආයතනය

ISBN: ......................

ආගම් හා සාරධර්ම අධ්‍යාපන දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය
මහරගම
ශ්‍රී ලංකාව

වෙබ් අඩවිය : www.nie.lk
විද්‍යුත් තැපෑල : info@nie.lk

මුද්‍රණය :
මුද්‍රණාලය
ජාතික අධ්‍යාපන ආයතනය

## අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ පණිවිඩය

ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් නිර්දේශ කරන ලද ජාතික මට්ටමේ නිපුණතා සංවර්ධනය කිරීමේ මූලික අරමුණ සහිත ව එවකට පැවති අන්තර්ගතය පදනම් වූ අධ්‍යාපනය වෙනුවට වර්ෂ අටකින් යුතු චක්‍රයකින් සමන්විත නව නිපුණතා පාදක විෂයමාලාවෙහි පළමු අදියර, වර්ෂ 2007 දී ශ්‍රී ලංකාවේ ද්විතීයික අධ්‍යාපන ක්ෂේත්‍රයට හඳුන්වා දෙන ලදි.

නව විෂයමාලා චක්‍රයේ දෙවන අදියර 2015 වර්ෂයේ දී හය වන සහ දහ වන ශ්‍රේණි සඳහා හඳුන්වා දීම කළ යුතු ව තිබේ. මේ සඳහා පර්යේෂණවලින් අනාවරණය වූ කරුණු ද අධ්‍යාපනය පිළිබඳ ව අවධානය යොමු කරන විවිධ පාර්ශවයන්ගේ යෝජනා ද පදනම් කොට ගෙන විෂය නිර්දේශ තාර්කීකරණය කිරීමේ ක්‍රියාවලියක් ජාතික අධ්‍යාපන ආයතනය විසින් හඳුන්වා දෙනු ලැබීය.

මෙම තාර්කීකරණ ක්‍රියාවලියේ දී සියලු ම විෂයයන්ගේ නිපුණතා මට්ටම්, පදනම් මට්ටමේ සිට උසස් මට්ටම දක්වා ක්‍රමානුකූල ව ගොඩ නැඟීම සඳහා පහළ සිට ඉහළට ගමන් කරන සිරස් සංකලනය භාවිත කරන ලදි. විවිධ විෂයයන්හි දී එක ම විෂය කරුණු නැවත නැවත ඉදිරිපත්වීම හැකිතාක් අවම කිරීම, වැඩි බර පැටවීම් වලින් යුක්ත විෂය අන්තර්ගතයන් අඩු කිරීම, සහ ක්‍රියාත්මක කළ හැකි ශිෂ්‍ය මිතුරු විෂයමාලාවක් සැකසීම සඳහා තිරස් සංකලනය භාවිත කර ඇත.

ගුරු භවතුන් සඳහා පාඩම් සැලසුම් කිරීම, ඉගැන්වීම, ක්‍රියාකාරකම් කරගෙන යෑම, මැනීම් හා ඇගයීම් යනා දී අංශයන් සඳහා අවශ්‍ය වන්නා වූ මාර්ගෝපදේශයන් ලබාදීමේ අරමුණින් මෙම නව ගුරු මාර්ගෝපදේශය හඳුන්වා දී ඇත. පංති කාමරය තුළ දී වඩාත් ඵලදායී ගුරුවරයෙකු ලෙස කටයුතු කිරීමට මෙම මාර්ගෝපදේශයන් උපකාර වනු ඇත. සිසුන්ගේ නිපුණතාවන් වර්ධනය කිරීම සඳහා ගුණාත්මක යෙදවුම් හා ක්‍රියාකාරකම් තෝරා ගැනීමට ගුරුවරුන්ට අවශ්‍ය නිදහස මෙමගින් ලබා දී තිබේ. එමෙන් ම නිර්දේශිත පාඨ ග්‍රන්ථවල ඇතුළත් වන විෂය කරුණු පිළිබඳ ව වැඩි බර තැබීමක් මෙම ගුරු මාර්ගෝපදේශවල අන්තර්ගත නොවේ. එම නිසා මෙම ගුරු මාර්ගෝපදේශය වඩාත් ඵලදායී වීමට නම් අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව විසින් සකසා ඇති අදාළ පාඨ ග්‍රන්ථ සමග සමගාමී ව භාවිත කිරීම අත්‍යවශ්‍ය වේ.

තාර්කීකරණය කරන ලද විෂය නිර්දේශ, නව ගුරු මාර්ගෝපදේශ හා අලුතින් සංවර්ධනය කර ඇති පාඨ ග්‍රන්ථවල මූලික අරමුණු වන්නේ ගුරු කේන්ද්‍රීය අධ්‍යාපන රටාවෙන් සිසු කේන්ද්‍රීය අධ්‍යාපන රටාවක් හා වඩාත් ක්‍රියාකාරකම් මත පදනම් වූ අධ්‍යාපන රටාවකට වෙනස්වීම මගින් වැඩ ලෝකයට අවශ්‍ය වන්නා වූ නිපුණතා හා කුසලතාවන්ගෙන් යුක්ත මානව සම්පතක් බවට ශිෂ්‍ය ප්‍රජාව සංවර්ධනය කිරීමය.

මෙම ගුරු මාර්ගෝපදේශය සම්පාදනය කිරීමේ දී ජාතික අධ්‍යාපන ආයතනයේ ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලය ද ආයතනයේ සභාව ද නන් අයුරින් දායකත්වය ලබා දුන් සියලු ම සම්පත්දායකයන් හා අනිකුත් පාර්ශවයන්ගේ ඉමහත් කැපවීම ඇගැයීමට ද මෙය අවස්ථාවක් කර ගනු කැමැත්තෙමි.

**අධ්‍යක්ෂ ජනරාල්**
**ජාතික අධ්‍යාපන ආයතනය**

## නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් හිමිගේ පණිවිඩය

ඉගෙනුම පුළුල් ක්ෂේත්‍රයක විහිද යන්නකි. එය ජීවිත අතිමහත් බවට ද, ඉතා ම සරල බවට ද පත් කරයි. මනුෂ්‍යයා ඉගෙනුම් කුසලතාවෙන් උත්කෘෂ්ට ය. මානව සමාජ සංවර්ධනය කේන්ද්‍ර කොට ගත් රටක්, සමාජයක් බුද්ධිය විසින් හඳුනා ගත් අසම්මතයන් බැහැර කිරීමට ද සුභාවිතයන් තුළින් නව ලොවක් නිර්මාණය කර ගැනීමට ද මෙවලම කර ගනු ලබන්නේ ඉගෙනුම යි.

ඉගෙනුම සඳහා වටිනා යමක් ද, ඉගෙනුම් ක්‍රමවේදයන් හා පහසුකම් ද අධ්‍යාපනය වටා නිර්මාණය විය යුතු ය. විෂය මාලාව, විෂය නිර්දේශය, මාර්ගෝපදේශ, සුසාධ්‍යකරුවන් ඉගෙනුම් ක්ෂේත්‍රයට එක්වනුයේ මේ ආකාරයෙනි.

නූතන ශ්‍රී ලංකාව ගෝලීය ප්‍රවණතාවන් මෙන් ම පුරාතන උරුමයන් ද සම්මිශ්‍රණය කර ගනිමින් ස්වීය අධ්‍යාපන රටාවක් හිමි කරගෙන ඇත. කාලීන අවශ්‍යතා මත ප්‍රතිසංස්කරණයන් තුළින් වසර අටකට වරක් යාවත්කාලීන වන විෂයමාලාවේ ඉගෙනුම් සම්පතක් ලෙස මෙම ගුරු මාර්ගෝපදේශ නිර්මාණය වේ.

විෂයයෙහි අරමුණුවල සංගතතාව ජාතික මට්ටමින් පවත්වා ගත යුතු ය. එහෙත් ගුරු මාර්ගෝපදේශයන් හි ඉගෙනුම් ක්‍රමවේදයන්, අකුරක්වත් වෙනස් නොකොට පිළිපැදිය යුත්තක් නම් නොවේ. විෂය නිර්දේශයෙහි නිපුණතා, නිපුණතා මට්ටම්, සාධනය වීම සඳහා අන්තර්ගතය තුළින් ඉගෙනුම් පල සම්ප්‍රාප්තිය පිණිස ඉගෙනුම් ක්‍රමවේද නිර්මාණශීලී ව වෙනස් කර ගැනීමට සුසාධ්‍යකරුවන්ට පැහැදිලිව ම ඉඩක් ඇති බව සඳහන් කරමි. ශිෂ්‍ය සාධන ප්‍රතිශතය ඉහළ මට්ටමකට ගැනීම සඳහා උදව් වන , පහසුකම් සලසන ගුරු භූමිකාවට කිසියම් ප්‍රවේශයක් සඳහා නිර්මාණය වන ගුරු මාර්ගෝපදේශය ශික්ෂකයාහට ද දෙගුරුනට ද භාවිත කළ හැක. අදාළ පෙළ පොතට සහකරුවකු වන ගුරු මාර්ගෝපදේශය තවත් පෙළ පොතක් නොවන බව දැන ගුරුභවතුන් ගුරු මාර්ගෝපදේශය හා අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවේ සම්පාදිත අදාළ පෙළ පොත යන සම්පත් ද්‍රව්‍ය දෙක ම භාවිත කළ යුතු ය.

ඒ ඒ විෂයයන්හි සාධනය පිළිබඳ ඇගයීම් සිදු කරන ජාතික මට්ටමේ පරීක්ෂකවරයෙකු වුවද අපේක්ෂා කරන සාධනයන්, විෂය ඉගැන්වීමට මග පෙන්වන සුසාධ්‍යකරුවන් විසින් පාඩම අවසානයෙහි පන්ති කාමරයේ දී දරුවන් සමඟ ප්‍රත්‍යක්ෂකරණයට පත් විය යුතු ය. එම ඒකාත්මික වීම සඳහා වූ ප්‍රබෝධාත්මක සංස්කෘතියක් ගොඩනගා ගැනීමට ගුරු මාර්ගෝපදේශය පහුරක්, යාත්‍රාවක් කර ගනු ඇතැයි ආයාචනා පූර්වක ව අපේක්ෂා කරමි.

**පීඨාධිපති, නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්**
**භාෂා, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය**
**ජාතික අධ්‍යාපන ආයතනය.**

## විෂයමාලා කමිටුව

**උපදේශකත්වය හා අනුමැතිය** : ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලය
ජාතික අධ්‍යාපන ආයතනය

**විෂය සම්බන්ධීකරණය** : කථිකාචාර්ය, පූජ්‍ය උඩුගම සුදස්සී හිමි
කථිකාචාර්ය, එස්. පී. විතාන මහතා

**විෂය කමිටුව** :

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ හිටපු කථිකාචාර්ය
අතිපූජ්‍ය ගන්තුනේ අස්සජී මහානායක හිමිපාණෝ
සබරගමුව පළාත් බුද්ධ ධර්මය විෂය අධ්‍යක්ෂ පූජ්‍ය මාවෙල සුමන හිමිපාණෝ
අධ්‍යාපන අමාත්‍යාංශයේ ආගමික හා සාරධර්ම අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ
අධ්‍යක්ෂ එස්.බී.එම්. නිමල් ධර්මසිරි මහතා
කෑගල්ල අධ්‍යාපන කලාපයේ ගුරු උපදේශක ඩබ්.ඒ.සී. වේරගොඩ මහත්මිය
ගා/අහංගම රෝහණ මහා විද්‍යාලයේ ආචාරිනී කේ.එස්. චන්ද්‍රානි මහත්මිය
මාලබේ, ආදර්ශ (පිරිමි) මහා විද්‍යාලයේ ආචාර්ය එස්.එම්.එන්.ගයා කාන්ත මහතා

**ලේඛක මණ්ඩලය** :

කැලණිය විශ්වවිද්‍යාලයේ බෞද්ධ හා පාලි පශ්චාත් උපාධි ආයතනයේ
කථිකාචාර්ය, පූජ්‍ය මඩිහේ සුගතසිරි හිමි
ජාතික අධ්‍යාපන ආයතනයේ කථිකාචාර්ය, පූජ්‍ය උඩුගම සුදස්සී හිමි
මාලබේ, යසෝදරා මහා විද්‍යාලයේ නියෝජ්‍ය විදුහල්පති උදයරුවන් මල්ලිකාරච්චි මහතා
පිළියන්දල අධ්‍යාපන කලාපයේ ගුරු උපදේශක එල්. එන්. ඒ. වීරසිංහ මහතා
රත්නපුර අධ්‍යාපන කලාපයේ ගුරු උපදේශක වයි. පී. පී. කව්සිගමුව මහත්මිය
කිරිල්ලවල මධ්‍ය විද්‍යාලයේ ආචාරිනී කේ. කේ. එස්. නිරෝෂණී වික්‍රමාරච්චි මහත්මිය

**විෂය සංස්කරණය** :

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ හිටපු කථිකාචාර්ය
අතිපූජ්‍ය ගන්තුනේ අස්සජී මහානායක හිමිපාණෝ

**භාෂා සංස්කරණය** :
සිංහල භාෂා දෙපාර්තමේන්තුව, ජාතික අධ්‍යාපන ආයතනය

**පරිගණක වදන් සැකසුම** :
මංගලිකා විජේරත්න මහත්මිය, කළමනාකරණ සහකාර 1, ජාතික අධ්‍යාපන ආයතනය

## ගුරු මාර්ගෝපදේශය පරිශීලනය කිරීම සඳහා උපදෙස්

බෞද්ධාගමික ඉගැන්වීම්වලට අනුකූල ව සාර්ථක ජීවිතයක් පවත්වා ගැනීමට සුදුසු වන පරිදි, අත්‍යවශ්‍ය නිපුණතා පාදක කොට ගෙන, පාසල් අධ්‍යාපනය හරහා එකී නිපුණතා සංවර්ධනය කර ගැනීම උදෙසා මගපෙන්වීමට මෙම ගුරු මාර්ගෝපදේශය සකස් කර ඇත.

දැනුමින් පමණක් පෝෂිත ව, දැනුම් කේන්ද්‍රීය විභාග ක්‍රමයක් යටතේ ඉහළ සාමාර්ථයක් ලැබුව ද එය ප්‍රමාණවත් නො වේ. සාර්ථක අධ්‍යාපන ක්‍රමයක දී හිස මෙන් ම හද හා අත ද පෝෂණය වීම අත්‍යවශ්‍ය වේ. මෙම අරමුණු ද සාක්ෂාත් කර ගැනීම ගුරු මාර්ගෝපදේශය සම්පාදනයේ දී අපේක්ෂා කර ඇත.

පාඩමට ප්‍රවේශය වඩාත් වැදගත් වන බැවින් ප්‍රබෝධාත්මක ආරම්භයක් ලබා දීම වැදගත් වේ. පාඩමේ සංවර්ධනයට අදාළ කර ගත හැකි යෙදවුම් ගුණාත්මක යෙදවුම් යන්නෙන් අදහස් කෙරේ. ඒ සඳහා

- පාඩමට අදාළ ව සංයුක්ත තැටි, පරිගණකය, බහු ප්‍රක්ෂේපණ යන්ත්‍රය (Multi Media)
- චිත්‍ර , ගීත, පුවත් පත්, සඟරා, ඇටවුම්, ප්‍රතිමා, මූර්ති, කැටයම්, ඡායාරූප
- පෙළ පොත, ලියන පුවරුව, කඩදාසි, විවිධ වර්ණ ඇතුළත් තීන්ත පෑන්, චලන රූප, කාන්දම් රඳවනය, පැනල් පුවරුව
- අදාළ කරගත හැකි වෙනත් සම්පත්

කණ්ඩායම් ක්‍රියාකාරකමක දී ශිෂ්‍ය කණ්ඩායමක සිටිය යුතු ප්‍රශස්ත සංඛ්‍යාව 07ක් ලෙස සැලකෙන බැවින් ඊට ගැළපෙන පරිදි සංවිධානය වීම වැදගත් ය. ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ දී වඩාත් සුදුසු ස්ථානය තෝරා ගැනීමට ගුරුවරයා උනන්දු විය යුතුය. (උදා. විහාරස්ථානය, පාසලේ බුදුමැදුර, රුක් සෙවනක් ආදි) පාඩමට (ක්‍රියාකාරකමට) පිවිසීමේ දී ප්‍රබෝධාත්මක ආරම්භය, පෙර අත්දැකීම් හා පාඩම පිළිබඳ කුතුහලය යන කරුණු ගැන සැලකිලිමත් වෙමින් ප්‍රදේශයේ සංස්කෘතික පසුබිම කෙරෙහි ද අවධානය යොමු විය යුතු ය. ශ්‍රද්ධාව ජනනය වන පරිදි ශාසනික වචන භාවිතය පිළිබඳ සැලකිලිමත් වන්න.

මෙහි ඇතුළත් පාඩම්වලට යෝජිත ඉගෙනුම්- ඉගැන්වීම් ක්‍රියාවලිය භාවිත කිරීම අනිවාර්ය නොවන අතර විකල්ප ඉගෙනුම් ක්‍රම, සුදුසු පරිදි භාවිත කළ හැකි ය. එහෙත් නිපුණතාව හා නිපුණතා මට්ටමෙන් බැහැර නොවිය යුතු ය. ඉගෙනුම් -ඉගැන්වීම් ක්‍රියාවලියේ දී යහපත් ආගමික ආකල්ප වර්ධනය කෙරෙහි ද ප්‍රායෝගික අවස්ථා යොදා ගැනීම කෙරෙහි ද වැඩි අවධානයක් යොමු කරන්න.

පාඩම ආරම්භයේ සිට අවසානය දක්වා තක්සේරුව සිදු කළ යුතු අතර හැකියා නොහැකියා අනුව ප්‍රතිපෝෂණය හා ඉදිරි පෝෂණය ලබා දිය යුතු ය. කණ්ඩායම් ගවේෂණ ක්‍රියාවලියෙන් අනාවරණය කර ගන්නා ඉගෙනුම් පල අභ්‍යාස පොත්වල කෙටියෙන් සටහන් කර ගැනීමට සිසුන්ට උපදෙස් දෙන්න. බොහෝ විට කාලසටහන් සැකසීමේ දී එකවිට කාලච්ඡේද දෙකක් එකවර නොලැබෙනු ඇත. එබැවින් අදාළ පාඩම කළමනාකරණය කර ගැනීම ඔබ සතු වගකීමකි. අදාළ පාඩමට අපේක්ෂිත ඇගයුම, තක්සේරුව හා ඇගයීම් නිර්ණායක අනුව ඇගයීම් සකස් කර ගන්න. ඔබ විසින් සිසුන්ට ලබා දෙන ලද අභ්‍යාසවල නිරවද්‍යතාව පරීක්ෂා කොට සටහන් තබන්න.

සෑම පාඩම් සටහනක් අවසානයේ ම යොදා ඇති ගෙදර පරිසරයෙන් යන කොටස දෙමාපිය වැඩිහිටි සහභාගිත්වය යටතේ සිදු කිරීමට යෝජිත ය. ඒ සඳහා අදාළ උපදෙස්, විදුහල්පති විසින් පාසල් සංවර්ධන සමිතියේ දී ද, විෂය භාර ගුරු භවතා විසින් පන්ති කවවල දී ද දෙමාපියන්ට හා වැඩිහිටියන්ට ලබා දීමට කටයුතු කළ යුතු ය.

**කථිකාචාර්ය, එස්. පී. විතාන**
**ව්‍යාපෘති නායක**

| පටුන | පිටුව |
| --- | --- |
| අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ පණිවුඩය | i |
| නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් හිමිගේ පණිවිඩය | i |
| විෂයමාලා කමිටුව | iii |
| ගුරු මාර්ගෝපදේශය පරිශීලනය සඳහා උපදෙස් | iv |
| විෂය නිර්දේශයේ අන්තර්ගතය | vii |
| ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා උපදෙස් | 1 |
| විවිධ සහාය | 51 |

# විෂය නිර්දේශයේ අන්තර්ගතය

## විෂය හැඳින්වීම

බුදු දහමෙහි විෂය කරුණු ප්‍රායෝගිකත්වයට නැඹුරු කරවීම අන් කවර යුගයකටත් වඩා වර්තමානයේ අත්‍යවශ්‍ය ව පවතී. හුදු වනපොත් කරණයෙන් හා දහම් කරුණු හැදෑරීමෙන් ඔබ්බට ගොස් දෛනික ජීවිතයේ මුහුණ දීමට සිදු වන විවිධ ගැටලුවල දී ඒවාට සාර්ථක ව මුහුණ දීම සඳහා දහම් කරුණු භාවිතයට නැඹුරු කරවීම අතිශය වැදගත් වේ.

පාසල් කාලසටහනෙහි වෙන් වී ඇත්තේ සතියකට කාලච්ඡේද දෙකක් වුව ද එම කාලය වඩාත් අර්ථවත් ව හා ඵලදායී ව යොදා ගැනීම දහම් ගුරු භවතාගේ වගකීමකි. සමබර පෞරුෂයකින් හෙබි පුරවැසියකු බිහි කිරීම සඳහා බුද්ධ ධර්මය විෂය නිර්දේශයෙහි දැක්වෙන නිපුණතා අත්පත් කර ගැනීම මහෝපකාරී වේ.

නව සහස්‍රකයේ පළමු විෂයමාලා ප්‍රතිසංස්කරණයෙහි අත්දැකීම් ද පාදක කොට ගනිමින් වඩාත් ගුණාත්මක පරිවර්තනයක් ඇති කිරීමටත් දෛනික ජීවිතයේ දී සැබෑ බෞද්ධයකු ලෙස දරුවාට කටයුතු කිරීමටත් විචාරශීලි මනසකින් හෙබි දැහැමි පුද්ගලයකු බිහිකිරීමටත් විෂය නිර්දේශය මග පාදනු ඇතැයි අපේක්ෂා කෙරේ.

6 ශ්‍රේණියේ සිට 11 ශ්‍රේණිය තෙක් විෂය නිර්දේශය පොදු නිපුණතා 10කින් සමන්විත වන අතර, ඒ ඒ ශ්‍රේණියට ගැළපෙන නිපුණතා මට්ටම්වලින් ද එම නිපුණතා මට්ටම් සාක්ෂාත් කර ගැනීමට වඩාත් උචිත විෂය සන්ධාරයකින් ද සමන්විත ය. ඉගෙනුම් ඉගැන්වීම් කාර්යයේ දී නිපුණතා මට්ටම් කෙරෙහි වැඩි අවධානයක් යොමු කොට එම නිපුණතා මට්ටම් සාක්ෂාත් කර ගත හැකි පරිදි විෂය සන්ධාරයට අදාළ කරුණු හරවත් ව පෙළ ගස්වා, සිසුන්ට ඉදිරිපත් කළ යුතු වේ. මෙම විෂය නිර්දේශයෙන් සැබවින් ම දරුවා සක්‍රීය ඉගෙනුමක් කරා ගෙන යාමටත් වඩාත් ප්‍රත්‍යක්ෂකරණයකට යොමු කිරීමෙන් දරුවන් තුළ දැහැමි බව වර්ධනය කිරීමටත් අපේක්ෂා කරනු ලැබේ. හැකි තරම් ප්‍රායෝගික අත්දැකීම්වලින් නිපුණතා මට්ටම් සාක්ෂාත් කර ගැනීමට සංවිධානය කිරීම ගුරුභවතුන් ඇතුළු විෂය භාර සියලු දෙනාගේ වගකීම වේ.

## ජාතික අධ්‍යාපන පද්ධතිය සඳහා අරමුණු

### ජාතික අරමුණු

පුද්ගලයාට හා සමාජයට අදාළ වන ප්‍රධාන ජාතික අරමුණු කරා ළඟා වීම සඳහා පුද්ගලයින්ට සහ කණ්ඩායම්වලට ජාතික අධ්‍යාපන පද්ධතිය සහාය විය යුතුය. වසර ගණනාවක් මුළුල්ලේ ශ්‍රී ලංකාවේ ප්‍රධාන අධ්‍යාපන වාර්තා සහ ලේඛන මගින් පුද්ගල හා ජාතික අවශ්‍යතාවන් සපුරාලීම සඳහා අරමුණු නියම කරනු ලැබීය. සමකාලීන අධ්‍යාපන ව්‍යුහයන් හා ක්‍රියාවලීන් තුළ දැකිය හැකි දුර්වලතා නිසා ධරණීය මානව සංවර්ධන සංකල්ප රාමුව ඇතුළත අධ්‍යාපනය තුළින් ළඟාකර ගත යුතු පහත දැක්වෙන අරමුණු ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් හඳුනා ගෙන ඇත. මෙම අරමුණු සපුරා ගැනීම අධ්‍යාපන පද්ධතිය සඳහා වූ තම ඉදිරි දැක්ම ලෙසට ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් ප්‍රත්‍යක්ෂ කොට ගෙන ඇත.

1. මානව අභිමානයට ගරු කිරීමේ සංකල්පය මත පිහිටා ශ්‍රී ලාංකික බහුවිධ සමාජයේ සංස්කෘතික විවිධත්වය අවබෝධ කර ගනිමින් ජාතික ඒකාබද්ධතාව, ජාතික ඍජු ගුණය, ජාතික සමගිය, එකමුතුකම සහ සාමය ප්‍රවර්ධනය කිරීම තුළින් ජාතිය ගොඩනැගීම සහ ලාංකීය අනන්‍යතාව තහවුරු කිරීම.
2. වෙනස් වන ලෝකයක අභියෝගයන්ට ප්‍රතිචාර දක්වන අතර ජාතික උරුමයේ මාහැඟි දායාදයන් හඳුනා ගැනීම සහ සංරක්ෂණය කිරීම.
3. මානව අයිතිවාසිකම්වලට ගරු කිරීම, යුතුකම් හා වගකීම් පිළිබඳ දැනුවත් වීම, හෘදයාංගම බැඳීමකින් යුතු ව එකිනෙකා කෙරෙහි සැලකිලිමත් වීම යන ගුණාංග වර්ධනය කිරීමට ඉවහල් වන සමාජ සාධාරණත්ව සම්මතයන් සහ ප්‍රජාතාන්ත්‍රික ජීවන රටාවක් ගැබ් වූ පරිසරයක් නිර්මාණය කිරීම සහ පවත්වා ගෙන යාමට සහාය වීම.
4. පුද්ගලයින්ගේ මානසික හා ශාරීරික සුව සම්පත සහ මානව අගයයන්ට ගරු කිරීම මත පදනම් වූ තිරසාර ජීවන ක්‍රමයක් ප්‍රවර්ධනය කිරීම.
5. සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාණ හැකියාව, ආරම්භක ශක්තිය, විචාරශීලී චින්තනය, වගකීම හා වගවීම ඇතුළු වෙනත් ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය කිරීම.
6. පුද්ගලයාගේ සහ ජාතියේ ජීව ගුණය වැඩිදියුණු කෙරෙන සහ ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනය සඳහා දායක වන ඵලදායී කාර්යයන් සඳහා අධ්‍යාපනය තුළින් මානව සම්පත් සංවර්ධනය කිරීම.
7. ශීඝ්‍රයෙන් වෙනස් වන ලෝකයක් තුළ සිදු වන වෙනස්කම් අනුව හැඩගැසීමට හා ඒවා පාලනය කර ගැනීමට පුද්ගලයන් සූදානම් කිරීම සහ සංකීර්ණ හා අනපේක්ෂිත අවස්ථාවන්ට සාර්ථක ව මුහුණ දීමේ හැකියාව වර්ධනය කිරීම.
8. ජාත්‍යන්තර ප්‍රජාව අතර ගෞරවනීය ස්ථානයක් හිමි කර ගැනීමට දායක වන යුක්තිය, සමානත්වය සහ අන්‍යෝන්‍ය ගරුත්වය මත පදනම් වූ ආකල්ප හා කුසලතා පෝෂණය කිරීම.

## මූලික නිපුණතා

අධ්‍යාපනය තුළින් වර්ධනය කෙරෙන පහත දැක්වෙන මූලික නිපුණතා ඉහත සඳහන් ජාතික අරමුණු මුදුන් පත් කර ගැනීමට දායක වනු ඇත.

1. **සන්නිවේදන නිපුණතා**

   සාක්ෂරතාව, සංඛ්‍යා පිළිබඳ දැනුම, රූපක භාවිතය සහ තොරතුරු තාක්ෂණ ප්‍රවීණත්වය යන අනු කාණ්ඩ 4ක් මත සන්නිවේදන නිපුණතා පදනම් වේ.

   **සාක්ෂරතාව** සාවධාන ව ඇහුම්කන් දීම, පැහැදිලි ව කථා කිරීම, තේරුම් ගැනීම සඳහා කියවීම, නිවැරදි ව සහ නිරවුල් ව ලිවීම, ඵලදායි අයුරින් අදහස් හුවමාරු කර ගැනීම

   **සංඛ්‍යා පිළිබඳ දැනුම** භාණ්ඩ, අවකාශය සහ කාලය, ගණන් කිරීම, ගණනය සහ මිනුම් සඳහා ක්‍රමානුකූල ඉලක්කම් භාවිතය

   **රූපක භාවිතය** රේඛා සහ ආකෘති භාවිතයෙන් අදහස් පිළිබිඹු කිරීම සහ රේඛා, ආකෘති හා වර්ණ ගළපමින් විස්තර, උපදෙස් හා අදහස් ප්‍රකාශනය හා වාර්තා කිරීම

   **තොරතුරු තාක්ෂණ ප්‍රවීණත්වය** පරිගණක දැනුම සහ ඉගෙනීමේ දී ද, සේවා පරිශ්‍රයන් තුළ දී ද, පෞද්ගලික ජීවිතයේ දී ද තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය උපයෝගී කර ගැනීම.

2. **පෞරුෂත්ව වර්ධනයට අදාළ නිපුණතා**

   - නිර්මාණශීලී බව, අපසාරී චින්තනය, ආරම්භක ශක්තිය, තීරණ ගැනීම, ගැටලු නිරාකරණය කිරීම, විචාරශීලී හා විග්‍රහාත්මක චින්තනය, කණ්ඩායම් හැඟීමෙන් කටයුතු කිරීම, පුද්ගලාන්තර සබඳතා, නව සොයා ගැනීම් සහ ගවේෂණය වැනි වර්ගීය කුසලතා
   - ඍජු ගුණය, ඉවසා දරා සිටීමේ ශක්තිය සහ මානව අභිමානයට ගරු කිරීම, වැනි අගයයන්
   - චිත්තවේගී බුද්ධිය

3. **පරිසරයට අදාළ නිපුණතා**

   මෙම නිපුණතා සාමාජික, ජෛව සහ භෞතික පරිසරයන්ට අදාළ වේ.

   **සමාජ පරිසරය** ජාතික උරුමයන් පිළිබඳ අවබෝධය, බහුවාර්ගික සමාජයක සාමාජිකයන් වීම හා සම්බන්ධ සංවේදීතාව හා කුසලතා, සාධාරණ යුක්තිය පිළිබඳ හැඟීම, සමාජ සම්බන්ධතා, පුද්ගලික චර්යාව, සාමාන්‍ය හා නෛතික සම්ප්‍රදායයන්, අයිතිවාසිකම්, වගකීම්, යුතුකම් සහ බැඳීම්

   **ජෛව පරිසරය** සජීවී ලෝකය, ජනතාව සහ ජෛව පද්ධතිය, ගස් වැල්, වනාන්තර, මුහුදු, ජලය, වාතය සහ ජීවය - ශාක, සත්ත්ව හා මිනිස් ජීවිතයට සම්බන්ධ වූ අවබෝධය, සංවේදී බව හා කුසලතා

   **භෞතික පරිසරය** අවකාශය, ශක්තිය, ඉන්ධන, ද්‍රව්‍ය, භාණ්ඩ සහ මිනිස් ජීවිතයට ඒවායේ ඇති සම්බන්ධතාව, ආහාර, ඇඳුම්, නිවාස, සෞඛ්‍ය, සුව පහසුව, ශ්වසනය, නින්ද, නිස්කලංකය, විවේකය, අපද්‍රව්‍ය සහ මළපහ කිරීම යනාදිය හා සම්බන්ධ වූ අවබෝධය, සංවේදීතාව හා කුසලතාව ඉගෙනීම, වැඩ කිරීම සහ ජීවත් වීම සඳහා මෙවලම් හා තාක්ෂණය ප්‍රයෝජනයට ගැනීමේ කුසලතා මෙහි අඩංගු වේ.

4. **වැඩ ලෝකයට සූදානම් වීමේ නිපුණතා**
   ආර්ථික සංවර්ධනයට දායක වීම. තම වෘත්තීය ළැදියා සහ අභියෝග්‍යතා හඳුනා ගැනීම. හැකියාවන්ට සරිලන අයුරින් රැකියාවක් තෝරා ගැනීම සහ වාසිදායක හා තිරසාර ජීවනෝපායක නිරත වීම. යන හැකියාවන් උපරිම කිරීමට හා ධාරිතාව වැඩි කිරීමට අදාළ සේවා නියුක්තිය හා සම්බන්ධ කුසලතා.

5. **ආගම සහ ආචාර ධර්මයන්ට අදාළ නිපුණතා**
   පුද්ගලයන්ට තම දෛනික ජීවිතයේ දී ආචාර ධර්ම, සදාචාරාත්මක හා ආගමානුකූල හැසිරීම් රටාවන්ට අනුගත වෙමින් වඩාත් උචිත දේ තෝරා එයට සරිලන සේ කටයුතු කිරීම සඳහා අගයයන් උකහා ගැනීම හා ස්වීයකරණය.

6. **ක්‍රීඩාව හා විවේකය ප්‍රයෝජනයට ගැනීමේ නිපුණතා**
   සෞන්දර්යය, සාහිත්‍යය, සෙල්ලම් කිරීම, ක්‍රීඩා හා මලල ක්‍රීඩා, විනෝදාංශ හා වෙනත් නිර්මාණාත්මක ජීවන රටාවන් තුළින් ප්‍රකාශ වන විනෝදය, සතුට, ආවේග සහ එවන් මානුෂික අත්දැකීම්.

7. **ඉගෙනීමට ඉගෙනුම් පිළිබඳ නිපුණතා**
   ශීඝ්‍රයෙන් වෙනස් වන, සංකීර්ණ හා එකිනෙකා මත යැපෙන ලෝකයක පරිවර්තන ක්‍රියාවලියක් හරහා වෙනස්වීම් හසුරුවා ගැනීමේ දී හා ඊට සංවේදී ව හා සාර්ථක ව ප්‍රතිචාර දැක්වීමත් ස්වාධීන ව ඉගෙන ගැනීමත් සඳහා පුද්ගලයින් හට ශක්තිය ලබා දීම.

ඉහත ජාතික අරමුණු හා මූලික නිපුණතා ශ්‍රී ලංකාවේ සාමාන්‍ය අධ්‍යාපනය පිළිබඳ ප්‍රතිපත්ති රාමුවක් සඳහා යෝජනා ඇතුළත් ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ 2003 දෙසැම්බර් වාර්තාවෙන් උපුටා ගැනිණ.

## විෂයයේ අරමුණු

(1) ත්‍රිවිධ රත්නයේ ගුණ හැඳින, ශ්‍රද්ධාවෙන් කටයුතු කරන, නිවැරදි ව ප්‍රායෝගික වතාවත්වල යෙදෙන දැහැමි දරු පරපුරක් බිහිකිරීම.

(2) ජීවන ගමනේ දී මුහුණ දෙන අභියෝග ජය ගැනීමට සහ නිවැරදි ජීවන දර්ශනයක් ගොඩනගා ගැනීමට බුදු දහමෙහි මූලික ඉගැන්වීම් උපයෝග කර ගැනීම පිණිස දරු පරපුරට මග පෙන්වීම.

(3) සුපෞරුෂයක් ගොඩනගා ගැනීම උදෙසා බෝසත් චරිතය, බුද්ධ චරිතය හා සිව්වනක් පිරිසට අයත් ශ්‍රේෂ්ඨ චරිත ආදර්ශ කොට ගැනීම සඳහා මග පෙන්වීම.

(4) ශ්‍රී ලාංකික උරුමය දායාද කොට ගත් අභිමානවත්, වගකීමෙන් සහ වගවීමෙන් යුතු දරු පරපුරක් ගොඩනගා ගැනීම.

(5) සිය ජීවන දර්ශනය ගොඩනගා ගැනීමේ දී ධම්මපද දේශනා සහ බෞද්ධ උපදේශ කාව්‍යය පදනම් කරගත් ඉගැන්වීම් චරිතායනයට මග පෙන්වීම.

(6) මානසික ඒකාග්‍රතාවෙන් යුතු සුසමාහිත පෞරුෂයක් ගොඩනගා ගැනීම සඳහා භාවනාව ප්‍රගුණ කිරීමට යොමු කරවීම.

(6) බෞද්ධ ශිෂ්ටාචාරයෙහි සුවිශේෂ අංග අධ්‍යයනය කොට, සහජීවනයෙන් කටයුතු කරන සිය අනන්‍යතාව රැක ගත් දරු පරපුරක් ගොඩනගා ගැනීම.

## විෂය නිර්දේශය

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 1.0 තෙරුවන ගුණ හැඳින චරිතායනය කරයි | **10.1.1 සිදුහත් බෝසත් සිරිතේ සුවිශේෂ සිදු වීම් ආදර්ශයට ගනිමින් ජීවිත අභියෝගවලට සාර්ථක ව මුහුණ දෙයි.** | සිදුහත් බෝසත් උපත, ශිල්ප හැදෑරීම, සතර පෙර නිමිති දැකීම, මහබිනික්මන | • බෝසත් උපත හා බැඳුණු සුවිශේෂ සිදු වීම් පැහැදිලි කරයි.<br>• බෝසත් චරිතයෙන් ආදර්ශ ලබා ගත හැකි බව පිළිගනියි.<br>• බෝසත් සිරිත ඇසුරින් ආදර්ශ පාඨ සකස් කරයි.<br>• ගැටලුවල දී ඉවසීම ප්‍රදර්ශනය කරයි.<br>• ආදර්ශවත් චරිත අධ්‍යයනය කොට ඒ අනුව හැසිරෙයි. | 02 |
| | **10.1.2 සඟරුවනෙහි සමාජ මෙහෙවර හැඳින සංඝ රත්නය රැක ගැනීමට පියවර ගනියි.** | සමාජ නායකත්වය, ආගමික මෙහෙවර, (දානමය පිංකම්, පිරිත් පිංකම්, ධර්ම දේශනා, මංගල - අවමංගල අවස්ථාවන්හි සහභාගිත්වය) | • සංඝරත්නයෙන් සිදු වන සමාජ මෙහෙවර පැහැදිලි කරයි.<br>• සඟ ගුණ පාඨයෙහි ගුණ නවය ඉස්මතු වන සේ නිවැරදි ව සජ්ඣායනය කරයි.<br>• සැදැහැ සිතින් විහාරස්ථානය ඇසුරු කරයි.<br>• ආගමික කටයුතුවල දී මූලිකත්වය ගෙන ක්‍රියා කරයි.<br>• භික්ෂූන් වහන්සේලාගේ පැවැත්මට දායක විය යුතු බව පිළිගනියි. | 02 |
| | **10.1.3 තෙරුවනෙහි සූවිසි ගුණ සමාලෝචනය කොට ආදර්ශ ලබා ගෙන ඒ අනුව ක්‍රියා කරයි.** | බුදුගුණ, දහම්ගුණ, සඟගුණ ඇසුරින් | • තෙරුවනෙහි සූවිසි ගුණ නම් කරයි.<br>• බෞද්ධ දරුවකු තෙරුවනෙහි ගුණ අනුව හැඩ ගැසිය යුතු බව පිළිගනී.<br>• තෙරුවන වන්දනා කරන පාඨවල සඳහන් ගුණ ඉස්මතු වන පරිදි සජ්ඣායනා කරයි.<br>• දෛනික ව තෙරුවන වන්දනයෙහි යෙදේ.<br>• ආගමික ශ්‍රද්ධාව ප්‍රදර්ශනය කරයි. | 02 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 2. ජීවන රටාව හැඩ ගසා ගැනීමට බෞද්ධ ඉගැන්වීම් හා ශ්‍රාවක ශ්‍රාවිකා චරිත උපයෝග කර ගනියි. | **10.2.1සමථ භාවනාව හැඳින භාවනාවේ යෙදෙයි.** | සමථ භාවනාව හැඳින්වීම පුද්ගල චරිත, සතර ඉරියව්, පූර්ව කෘත්‍ය | • සමථ භාවනාව සුවිශේෂ ව විස්තර කරයි.<br>• සමථ භාවනාව වැඩීමෙන් සිත එකඟ කර ගත හැකි බව පිළිගනියි.<br>• නිවැරදි ඉරියව් පවත්වමින් සමථ භාවනාවක යෙදෙයි.<br>• මනා සිහියෙන් දෛනික කාර්යයන් හි යෙදෙයි.<br>• භාවනාව ජීවන පුරුද්දක් කර ගනියි. | 02 |
| | **10.2.2 විපස්සනා භාවනාව ප්‍රගුණ කොට ජීවිතය යථාවබෝධයෙන් දැකීමට උත්සාහ කරයි.** | විදර්ශනා භාවනාව | • විපස්සනා භාවනාව ප්‍රගුණ කළ යුතු ආකාරය පැහැදිලි කරයි.<br>• විපස්සනා භාවනාව නිර්වාණාවබෝධය සඳහා හේතු වන බව පිළිගනී.<br>• විපස්සනා භාවනාව වැඩීමේ දී අනුගමනය කළ යුතු ක්‍රියා මාර්ග පිළිබඳ උපදෙස් පත්‍රිකාවක් සකස් කරයි.<br>• දෛනික ජීවිතයේ සිදුවීම් විශ්ලේෂණාත්මක ව දකියි.<br>• වෙනස් වීමට ඔරොත්තු දෙයි. | 02 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 10.2.3 ශ්‍රාවක ශ්‍රාවිකා චරිත ඇසුරින් ජීවිතාදර්ශ ලබා ගෙන තම දිවිය සාර්ථක කර ගනියි. | • වැලිවිට සරණංකර සංඝරාජ නාහිමි, දුටුගැමුණු රජතුමා | • වැලිවිට සංඝරාජ හිමි හා දුටුගැමුණු රජතුමාගේ චරිතවලින් සිදු වූ සමාජ මෙහෙවර පැහැදිලි කරයි.<br>• මෙම චරිතවලින් ජීවිතාදර්ශ ලැබිය හැකි බව පිළි ගනියි.<br>• මෙම චරිතවලට ආරෝපණය වී කතා කරයි.<br>• ආදර්ශවත් චරිත පිළිබඳ සොයා බලයි.<br>• අභිමානයක් ඇතිකර ගත හැකි පරිදි තම චරිතය සංවර්ධනය කර ගනියි. | 02 |
| | 10.2.4 ධම්මපද ගාථා ඇසුරින් ආදර්ශ ලබා ගෙන ජීවිතය සාර්ථක කර ගැනීමට කටයුතු කරයි. | • "අචරිත්වා බ්‍රහ්මචරියං" යන ගාථා යුගලය සහ "උට්ඨානවතෝ සතිමතෝ" යන ධම්මපද ගාථා හා ඒවායේ තේරුම් | • "අචරිත්වා බ්‍රහ්මචරියං" සහ "උට්ඨානවතෝ සතිමතෝ" යන ධම්මපද ගාථාවල සරල අදහස පැහැදිලි කරයි.<br>• ධම්මපද ගාථාවලින් ජීවිතාදර්ශ ලබා ගත හැකි බව පිළිගනියි.<br>• ගාථා නිවැරදි ව සජ්ඣායනා කරයි.<br>• නිසිකල නිසි වැඩෙහි යෙදෙයි.<br>• කාලයෙන් උපරිම ප්‍රයෝජන ලබා ගනියි. | 02 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 3.0 බෞද්ධ සාරධර්ම අගය කරමින් පිළිපදියි | 10.3.1 **සීලය සුරැකීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු දැන ක්‍රියා කරයි.** | • සීලයේ ආනිසංස | • සීලයෙහි ආනිසංස පැහැදිලි කරයි.<br>• සීලයෙහි පිහිටා කටයුතු කිරීමට කැමැත්ත පළ කරයි.<br>• උදෑසන රැස්වීමට සුදුසු සීලයෙහි අගය පැහැදිලි කෙරෙන කථා පිටපතක් සකස් කරයි.<br>• වැඩිහිටියන්ට කීකරු වෙයි.<br>• සුචරිතවත් ජීවිතයක් ගත කරයි. | 02 |
| | 10.3.2 **සදිසා නමස්කාරය ඇසුරින් තම යුතුකම් හැඳින සමාජ යුතුකම් ඉටු කිරීමට ක්‍රියා කරයි.** | • සදිසා නමස්කාරය<br>(සිගාලෝවාද සූත්‍රය) | • සදිසාවෙන් දැක්වෙන යුතුකම් හා වගකීම් පැහැදිලි කරයි.<br>• තම යුතුකම් ඉටුකිරීමට සැලකිලිමත් වෙයි.<br>• සදිසාවන්හි දැක්වෙන යුතුකම් "ඊ" සටහනකින් නිරූපණය කරයි.<br>• සමාජ සබඳතාවල දී සහකම්පනයෙන් කටයුතු කරයි.<br>• යහපත් සමාජ සබඳතා ගොඩනගා ගනියි. | 02 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 4.0 සුසමාහිත සමබර පෞරුෂයක් ගොඩනගා ගැනීමට කටයුතු කරයි. | **10.4.1 වැරදි බහුල සමාජයක ඉන් මිදී නිවැරදි ජීවිතයක් ගත කළ හැකි බව පිළිගෙන ඒ අනුව ක්‍රියා කරයි.** | • පද්මාකාර ජීවිතය | • පද්මාකාර ජීවිතය යනු කුමක්දැ යි පැහැදිලි කරයි.<br>• පද්මාකාර ජීවිතය අගය කරයි.<br>• පද්මාකාර ජීවිතයක ලක්ෂණ ලැයිස්තු ගත කරයි.<br>• වැරදි බහුල සමාජයක ඉන් මිදී යහපත වෙනුවෙන් කටයුතු කරයි.<br>• චරිත පාරිශුද්ධිය සඳහා කටයුතු කරයි. | 02 |
| 5.0 ශ්‍රී ලාංකික බෞද්ධ අනන්‍යතාව සුරකිමින් සාමයෙන් හා සහජීවනයෙන් ක්‍රියා කරයි | **10.5.1 බුදු දහමෙන් ගොඩනගා ගත් අනන්‍යතාව දෛනික ජීවිතයේ දී ප්‍රදර්ශනය කරයි.** | • අන්‍යාගමික ඇසුර පැවැත්විය යුතු අයුරු, දැහැමි රැකියා, අවුරුදු චාරිත්‍ර, ආපදාපන්න අවස්ථාවන්හි දී කටයුතු කිරීම, පොදු දේපල පරිහරණය | • චාරිත්‍ර වාරිත්‍ර පැහැදිලි කරයි.<br>• ආපදාපන්න අවස්ථාවල දී සහයෝගයෙන් ක්‍රියා කළ යුතු බව පිළිගනියි.<br>• පොදු දේපොළ සුරැකීමට අනුගමනය කරන ක්‍රියාමාර්ග ලැයිස්තු ගත කරයි.<br>• අන්‍යාගමික මතවලට ද ගරු කරමින් සහයෝගයෙන් කටයුතු කරයි.<br>• පොදු මතයන්ට ගරු කරමින් දැහැමි ජීවිතයක් ගත කරයි. | 02 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 6.0 බුදු දහමට අනුව ජීවිතය හා ලෝකය හැඳින ගෙන ප්‍රඥාවන්ත ජීවිතයක් ගත කරයි. | **10.6.1 කර්මය හා කර්ම විපාක පිළිබඳ නිවැරදි දැක්මෙන් කටයුතු කරයි.** | කර්මය, කර්මයේ ප්‍රභේද, කර්ම විපාක | • කර්මය, කර්මයේ ප්‍රභේද හා එහි විපාක සංක්ෂිප්ත ව ඉදිරිපත් කරයි.<br>• කර්මය දෙලොව දීම විපාක දෙන බව පිළිගනියි.<br>• කර්මයේ ප්‍රභේද ගැලීම් සටහනකින් දක්වයි.<br>• කිසියම් ක්‍රියාවක් සිදු කිරීමේ දී හොඳ නරක පිළිබඳ සැලකිලිමත් වෙයි.<br>• සුචරිතවත් ජීවිතයක් ගත කරයි. | 02 |
| | **10.6.2 ත්‍රිලක්ෂණ ධර්මතාව හැඳින යථාවබෝධයෙන් කටයුතු කරයි.** | ත්‍රිලක්ෂණය | • ත්‍රිලක්ෂණ ධර්මතාව හැඳින පැහැදිලි කරයි.<br>• ත්‍රිලක්ෂණය ලොව පවතින සියලු ධර්මතාවලට පොදු වූවක් බව පිළිගනියි.<br>• අනිත්‍යතාව ප්‍රකට වන කතා පුවතක් ගොඩ නගයි.<br>• වෙනස් වීමට ඔරොත්තු දීමේ ශක්තිය ප්‍රදර්ශනය කරයි.<br>• අකම්පිත ව යථාර්ථයට මුහුණ දෙයි. | 02 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 6.0 බුදු දහමට අනුව ජීවිතය හා ලෝකය හැඳින ගෙන ප්‍රඥාවන්ත ජීවිතයක් ගත කරයි. | **10.6.3 පටිච්ච සමුප්පාද න්‍යාය ගැටලු නිරාකරණයට භාවිත කරයි.** | පටිච්ච සමුප්පාද මූල සූත්‍රය '' ඉමස්මිං සති ඉදං හෝති'' පාඨය සහ '' යෙ ධම්මා හේතුප්පභවා '' ගාථාව | • පටිච්ච සමුප්පාද න්‍යාය දැක්වෙන මූල සූත්‍රයේ අදහස පැහැදිලි කරයි.<br>• සියලු ම දේ හේතුඵල සම්බන්ධතාවෙන් හටගන්නා බව පිළිගනියි.<br>• මූල සූත්‍රය හා "යේ ධම්මා හේතුප්පභවා ........" යන ගාථාව මතකයෙන් කියයි.<br>• ගැටලු නිරාකරණයේ දී එහි හේතුඵල සම්බන්ධතාව සොයා බලයි.<br>• පොදු ගැටලු අධ්‍යයනය කොට අන් අයට නිවැරදි ව මග පෙන්වයි. | 02 |
| | **10.6.4 ආර්ය සත්‍ය හතර නිවැරදි ව හැඳින හරවත් ජීවිතයක් ගත කරයි.** | චතුරාර්ය සත්‍යය සමාලෝචනය | • උතුම් ආර්ය සත්‍ය හතර පිළිබඳ පැහැදිලි විග්‍රහයක් කරයි.<br>• දුක හට ගැනීමට හේතුව සමුදය සත්‍යයෙන් ප්‍රකට වන බව පිළිගනියි.<br>• දුක්ඛ නිරෝධ ගාමිණී පටිපදා ආර්ය සත්‍යයට අයත් මධ්‍යම ප්‍රතිපදාව පිළිවෙළින් ලියා දක්වයි.<br>• විශ්ලේෂණාත්මක ව ගැටලු විසඳා ගනියි..<br>• ජීවිත අවබෝධයෙන් යුතු ව කටයුතු කරයි. | 02 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 7.0 ජීවි අජීවි පරිසරයට හිතකාමී ව හැසිරෙයි. | 10.7.1 බුදුරජාණන් වහන්සේ ජීව, අජීව පරිසරය කෙරෙහි හිතකාමී ව ගත කළ අයුරු දැන පරිසර සංවේදී ජීවිතයක් ගත කිරීමට ක්‍රියා කරයි. | බුදු සිරිතේ ස්වාභාවික පරිසරය හා බැඳුණු අවස්ථා | • බුදු සිරිත හා සම්බන්ධ ස්වාභාවික පරිසරය හා බැඳුණු අවස්ථා ගෙනහැර දක්වයි.<br>• ජීවී පැවැත්මට ස්වාභාවික පරිසරයෙන් ලැබෙන දායකත්වය අගය කරයි.<br>• ජීවි අජීවී පරිසරය හා බැඳුණු සිදුවීමක් ඇසුරින් නාට්‍ය පිටපතක් සකස් කර රඟ දක්වයි.<br>• තම පරිසරය ප්‍රසන්න ව පවත්වා ගනියි.<br>• පරිසරය සංරක්ෂණයෙහි යෙදෙයි. | 02 |
| | 10.7.2 නීරෝගකාවට අදාළ බෞද්ධ ඉගැන්වීම් හැඳින සෞඛ්‍ය සම්පන්න ජීවිතයක් ගත කරයි. | විනය පිටකයේ අදාළ ඉගැන්වීම් | • බුදුරජාණන් වහන්සේ අනුදත් දින චරියාව පැහැදිලි කරයි.<br>• බුදුරජාණන් වහන්සේගේ දින චරියාවෙන් ආදර්ශ ලැබිය හැකි බව පිළිගනියි.<br>• අධ්‍යාපන කටයුතු සාර්ථක කර ගැනීමට යෝග්‍ය කාලසටහනක් සකස් කරයි.<br>• කාල කළමනාකරණයෙන් යුතු ව කටයුතු කරයි.<br>• විවේකය ඵලදායී ව ගත කරයි. | 02 |
| | 10.7.3 ආහාර පරිභෝජනයේ දී බුදු සිරිත ඇසුරින් ආදර්ශ ගෙන කටයුතු කරයි. | වර්තමාන අහිතකර ආහාර රටාව, නිවැරදි ආහාර රටාවක් තෝරා ගැනීම (බුදු සිරිතේ නිදසුන්) | • නිරෝගිතාවට අදාළ බෞද්ධ ඉගැන්වීම ගෙනහැර දක්වයි.<br>• බෞද්ධ ඉගැන්වීම් අනුව ක්‍රියා කිරීමෙන් කායික, මානසික නිරෝගිතාව පවත්වා ගත හැකි බව පිළිගනියි.<br>• නිරෝගී පැවැත්මට ඉවහල් වන උපදෙස් පත්‍රිකාවක් පිළියෙල කරයි.<br>• ආහාර තෝරා ගැනීමේ දී නිරෝගිතාව පිළිබඳ සැලකිලිමත් වෙයි.<br>• සෞඛ්‍ය සම්පන්න දිවි පැවැත්මක් | 02 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 8.0 ශාසන ඉතිහාසය හා ශ්‍රී ලාංකික බෞද්ධ උරුමය හැඳින එම උරුමය රැක ගැනීමට ක්‍රියා කරයි. | **10.8.1 ශාසන පැවැත්ම උදෙසා ධර්ම සංගායනාවලින් වූ සේවය හැඳින, ශාසන සුරක්ෂිතතාවට දායක වෙයි.** | ථෙරවාද ධර්ම සංගායනා පිළිවෙළේ සතර වැන්න මාතලේ අලුවිහාර සංගායනාව, ඉන්දීය ඉතිහාසයේ ධර්ම සංගායනා පිළිවෙළෙහි සතර වැන්න කණිෂ්ක සංගායනාව | • අලුවිහාර ධර්ම සංගායනාව හා කණිෂ්ක ධර්ම සංගායනාව පිළිබඳ වැදගත්කම විස්තර කරයි.<br>• සංගායනා ශාසන චිරස්ථිතියට හේතු වූ බව පිළිගනියි.<br>• සංගායනා දෙක සංසන්දනය කරමින් ප්‍රතිඵල ලැයිස්තු ගත කරයි.<br>• නිසි අවස්ථාවේ දී ම සුරක්ෂිත කළ යුතු දෑ සුරක්ෂිත කිරීමට කැපවෙයි.<br>• සාකච්ඡා මාර්ගයෙන් විසඳුම් සොයයි. | 02 |
| | **10.8.2 ශාසන ඉතිහාසයෙන් උරුම වූ ගෘහ නිර්මාණ ශිල්ප, චිත්‍ර හා කැටයම් අගයමින් ඒවා සංරක්ෂණය කිරීමට දායක වෙයි.** | ස්තූපය, ස්තූප වර්ග, ස්තූපයක කොටස්, චෛතියඝර, වාහල්කඩ, පියගැට පෙළ මුරගල, කොරවක්ගල, සඳකඩ පහණ, බෝධිඝර අනුරාධපුර, පොළොන්නරු චිත්‍ර | • ශාසන ඉතිහාසයෙන් අපට උරුම වූ කලා නිර්මාණ මොනවාදැයි පැහැදිලි කරයි.<br>• කලා ශිල්ප සංරක්ෂණය කළ යුතු බව පෙන්වා දෙයි.<br>• ගෘහ නිර්මාණ, චිත්‍ර කැටයම්වලට අදාළ නිර්මාණ වෙන් වෙන් ව ලැයිස්තු ගත කරයි.<br>• අතීත උරුමයන් අගයමින් ආරක්ෂා කරයි.<br>• පෞරාණික ස්ථාන නැරඹීමේ දී ඒවායේ පෞරාණිකත්වයට හානි නොවන සේ කටයුතු කරයි. | 02 |
| | **10.8.3 බුදු දහම ඇසුරින් පෝෂණය වූ සිංහල සාහිත්‍යය රසාස්වාදය කරමින් ඒවා සංරක්ෂණයට දායක වෙයි.** | අනුරාධපුර, පොලොන්නරු, දඹදෙණි යුගයන්හි ගද්‍ය - පද්‍ය සාහිත්‍ය | • අනුරාධපුර, පොලොන්නරු හා දඹදෙණි යුගයන්හි බෞද්ධ සාහිත්‍ය කෘති නම් කරයි.<br>• බෞද්ධ සාහිත්‍ය ග්‍රන්ථ පරිශීලනයෙන් රසාස්වාදයක් ලැබිය හැකි බව පිළිගනියි.<br>• ඉහත යුගයන්හි ගද්‍ය පද්‍ය සාහිත්‍යය කෘති අනුපිළිවෙළට ලැයිස්තු ගත කරයි.<br>• සාහිත්‍ය කෘතිවල අන්තර්ගතය සොයා බලයි.<br>• පැරණි සාහිත්‍ය කෘති සංරක්ෂණයට දායක වෙයි. | 02 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 9.0 බෞද්ධ ආර්ථික හා රාජ්‍ය පාලන චින්තනය හැඳින ගෙන ඒ අනුව ක්‍රියා කරයි. | **10.9.1 බෞද්ධ රාජ්‍ය පාලන ප්‍රතිපත්ති හදාරා තම ජීවිතයේ නායකත්ව අවස්ථාවන්ට සාර්ථක ව මුහුණ දෙයි.** | දස සක්විතිවත්, සප්ත අපරිහානීය ධර්ම, සතර සංග්‍රහ වස්තු, සතර අගති විරතිය ප්‍රායෝගික ජීවිතයට සම්බන්ධ කිරීම | • රාජ්‍ය පාලනයට උපයෝගි කරගත හැකි බෞද්ධ ප්‍රතිපත්ති විස්තර කරයි.<br>• ධාර්මිකත්වය පදනම් කොට බෞද්ධ රාජ්‍ය පාලන ප්‍රතිපත්ති සකස් වී ඇති බව පිළිගනියි.<br>• බෞද්ධ රාජ්‍ය පාලන ප්‍රතිපත්ති සංකල්ප සිතියමක් මගින් ඉදිරිපත් කරයි.<br>• වගකීමෙන් හා වගවීමෙන් යුතු ව කටයුතු කරයි.<br>• නීති ගරුක ව ජීවත් වේ. | 02 |
| 10.0 නිර්වාණය අරමුණු කොටගෙන ආර්ය මාර්ගයේ ගමන් කරයි. | **10.10.1 ශ්‍රද්ධාව පෙරටු කොට ආර්ය මාර්ගයේ ගමන් කිරීමට රාග, ද්වේශ, මෝහ පාලනය කළ යුතු බව පිළිගෙන ක්‍රියා කරයි.** | ශ්‍රද්ධාව රාගක්ඛය, දෝසක්ඛය, මෝහක්ඛය | • ආර්ය මාර්ගයේ ගමන් කිරීම සඳහා ශ්‍රද්ධාව මුල් වන ආකාරය පැහැදිලි කරයි.<br>• රාග, ද්වේශ, මෝහ පාලනය කිරීමෙන් සැනසිලිදායක ජීවිතයක් ගත කළ හැකි බව පිළිගනියි.<br>• අනිසි ලෙස පසිඳුරන් පිනවීමේ ආදීනව මැයෙන් කථාවක් පවත්වයි.<br>• ගැටුම් ඇති වීමට හේතු නිරන්තරයෙන් සොයා බලයි.<br>• සහනශීලී ජීවිතයක් ගත කරයි. | 02 |

# ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා උපදෙස්

**නිපුණතාව 01** : තෙරුවන ගුණ හැඳින චරිතායනය කරයි.

**නිපුණතා මට්ටම 10.1.1** : සිදුහත් බෝසත් සිරිතේ සුවිශේෂ සිදුවීම් ආදර්ශයට ගනිමින් ජීවිත අභියෝගවලට සාර්ථක ව මුහුණ දෙයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02 යි.

**ඉගෙනුම් පල** :

- බෝසත් උපත හා බැඳුණු සුවිශේෂ සිදුවීම් පැහැදිලි කරයි.
- බෝසත් චරිතයෙන් ආදර්ශ ලබා ගත හැකි බව පිළිගනියි.
- බෝසත් සිරිත ඇසුරින් ආදර්ශ පාඨ සකස් කරයි.
- ගැටලුවල දී ඉවසීම ප්‍රකට කරයි.
- ආදර්ශවත් චරිත අධ්‍යයනය කොට ඒ අනුව හැසිරෙයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්** :

සිදුහත් බෝසත් උපත, ශිල්ප හැදෑරීම, සතර පෙර නිමිති දැකීම හා මහබිනික්මන පිළිබඳ විස්තරාත්මක අධ්‍යයනයක් මෙම පාඩමෙන් අපේක්ෂිත ය.

**පියවර 1** :

- බෝසත් උපත, ශිල්ප දැක්වීම, සතර පෙර නිමිති දැකීම පිළිබඳ වූ චිත්‍ර සිසුන්ට ඉදිරිපත් කොට, පහත කරුණු ද මතු කරමින් සාකච්ඡාවක් මෙහෙයවන්න.
  - බෝසත් උපත අසිරිමත් සිදුවීමක් බව
  - බුදු කෙනෙකුගේ පහළ වීම ලෝකයට ආශිර්වාදයක් බව
  - මෙම සුවිශේෂ සිදුවීම් ජීවිත අභියෝග ජය ගැනීමට යොදා ගන්නේ කෙසේදැයි සොයා බැලිය යුතු බව

**පියවර 2** :

- සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් කොට ගවේෂණ පත්‍රිකා සිසුන් අතර බෙදා දී, අදාළ ක්‍රියාකාරකමෙහි සිසුන් නිරත කරවන්න.

**පියවර 3** :

- කණ්ඩායම් අනාවරණ පන්තියට ඉදිරිපත් කරන්නට හා, ඌන පූරණ හෝ සංවර්ධනාත්මක යෝජනා සඳහා සිසුන්ට අවස්ථාව ලබා දෙමින්, පහත සඳහන් කරුණු ද මතු කරමින් සමාලෝචනයක යෙදෙන්න.
  - බෝසත් උපත හා බැඳුණු අභියෝගාත්මක අවස්ථා රැසක් ඇති බව
  - පංච මහා විලෝකනය මගින් පූර්ව අධ්‍යයනයක් කළ බව
  - දේවදත්ත කුමරුගේ ක්‍රියා කලාපයන්ට ප්‍රතිචාර දැක් වූ බව
  - ඥාතීන් ඉදිරියේ ශිල්ප දැක් වූ බව

- විවාහය සඳහා සුදුසු කුල කුමරියක් තෝරා ගත් බව
- අසන, දකින දේ විමර්ශනාත්මක ව අධ්‍යයනය කළ යුතු බව
- ජීවිතයේ යථාර්ථයන්ට මුහුණ දීමට නොබියව ඉදිරිපත් විය යුතු බව
- කිසාගෝතමියගේ නිබ්බුත පද  අසා ප්‍රසාදයට පත් කුමරු සිය මුතුහර තෑගි කළ බව
- සත්‍ය හා කුසලය වෙනුවෙන් රජ සම්පත් අත්හළ බව
- බෝසත් සිරිත ඇසුරින් ශිෂ්‍ය ජීවිතයේ අභියෝග ජය ගත හැකි බව

**ගුණාත්මක යෙදවුම්** : පොදු උපදෙස් අනුව ගුරුභවතාගේ අභිමතය පරිදි යොදා ගත හැකි ය.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**
මෙම නිපුණතා මට්ටමට අදාළ ඉගෙනුම් පල සාධනය  වූ ප්‍රමාණයන් මැන බැලීමට සුදුසු ආකාරයේ නිර්ණායක  සකස් කර ගැනීමට ගුරු භවතාට නිදහස ඇත.

**ගවේෂණ පත්‍රිකාව** :

1. සිදුහත් බෝසත් සිරිත හා බැඳි සුවිශේෂ සිදුවීම්වලට සම්බන්ධ පහත දැක්වෙන වගුව සම්පූර්ණ කරන්න.

| මුහුණ දුන් අභියෝගය | ජයගත් ආකාරය |
|---|---|
| | |

2. බෝසත් සිරිත ආදර්ශයට ගනිමින් ඔබට මුහුණ දීමට සිදු වන දෛනික අභියෝග ජය ගැනීමට කටයුතු කරන ආකාරය පන්තියට ඉදිරිපත් කරන්න.

| මුහුණ දෙන අභියෝගය | ජය ගන්නා අන්දම |
|---|---|
| | |

**ගෙදර පරිසරයෙන්** :

ඔබේ දරුවා මුහුණ දෙන ගැටලු සහගත අවස්ථා පිළිබඳ අවධානයෙන් සිට සුහදශීලී ව මැදිහත් වී මග පෙන්වීම් කරන්න.

**නිපුණතාව 01 :** තෙරුවන ගුණ හැඳින චරිතායනය කරයි.

**නිපුණතා මට්ටම 10.1.2:** සඟරුවනෙහි සමාජ මෙහෙවර හැඳින සංඝ රත්නය රැක ගැනීමට පියවර ගනියි.

**කාලච්ඡේද සංඛ්‍යාව :** 02 යි.

**ඉගෙනුම් පල :**

- සංඝරත්නයෙන් සිදු වන සමාජ මෙහෙවර පැහැදිලි කරයි.
- භික්ෂූන් වහන්සේලාගේ පැවැත්මට දායක විය යුතු බව පිළිගනියි.
- සංඝරත්නයෙන් සිදු වන සමාජ, ආගමික මෙහෙවර ලැයිස්තු ගත කරයි.
- සැදැහැ සිතින් විහාරස්ථානය ඇසුරු කරයි.
- ආගමික කටයුතුවල දී මූලිකත්වය ගෙන ක්‍රියා කරයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස් :**

සංඝරත්නයේ සමාජ නායකත්වය හා ආගමික මෙහෙවර පිළිබඳ ව අවබෝධයක් ලබා ගැනීම මෙම පාඩමෙන් අපේක්ෂිත ය.

**පියවර 1 :**

- ආගමික හා සමාජ කටයුතුවල නියැලීම හොඳ පුරුද්දක් බවත්, පන්සල හා ගම අන්‍යෝන්‍ය වශයෙන් බැඳීම අත්‍යවශ්‍ය බවත් පෙන්වා දෙමින් සාකච්ඡාවක් මෙහෙයවන්න.

**පියවර 2 :**

- සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් කොට ගවේෂණ පත්‍රිකා සිසුන් අතර බෙදා දී, අදාළ ක්‍රියාකාරකමෙහි සිසුන් නිරත කරවන්න.

**පියවර 3 :**

- කණ්ඩායම් අනාවරණ පන්තියට ඉදිරිපත් කරන්නට හා, ඌනපූරණ හෝ සංවර්ධනාත්මක යෝජනා සඳහා සිසුන්ට අවස්ථාව ලබා දෙමින්, පහත සඳහන් කරුණු ද මතු කරමින් සමාලෝචනයක යෙදෙන්න.
  - සංඝරත්නයෙන් ඉටු වන මෙහෙය අගය කළ යුතු බව
  - පුද්ගල ජීවිතයේ උපතේ සිට මරණය දක්වා සෑම වැදගත් අවස්ථාවක දී ම සංඝරත්නයේ මග පෙන්වීම හා ආශිර්වාදය ලැබෙන බව
  - සංඝරත්නය රැක ගැනීමට කටයුතු කළ යුතු බව (සිව් පසයෙන් සංග්‍රහ කිරීම)

**ගුණාත්මක යෙදවුම් :** පොදු උපදෙස් අනුව ගුරු භවතාගේ අභිමතය පරිදි යොදා ගත හැකි ය.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

මෙම නිපුණතා මට්ටමට අදාළ ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණයන් මැන බැලීමට සුදුසු ආකාරයේ නිර්ණායක සකස් කරගැනීමට ගුරු භවතාට නිදහස ඇත.

**ගවේෂණ පත්‍රිකාව :**

කණ්ඩායම 1. භික්ෂූන් වහන්සේ වෙතින් සිදු වන සමාජ සේවාවන් පිළිබඳ ලැයිස්තුවක් පිළියෙල කරන්න.

කණ්ඩායම 2. සංඝ රත්නය රැක ගැනීමට අනුගමනය කළ හැකි ක්‍රියා මාර්ග පෙළ ගස්වන්න.

කණ්ඩායම 3. සංඝරත්නය රැක ගැනීමෙන් බුදු සසුනේ පැවැත්මට සිදු වන යහපත පැහැදිලි කරන්න.

**ගෙදර පරිසරයෙන් :**

හැකි සෑම අවස්ථාවක ම පවුලේ සියලු දෙනා සමීප විහාරස්ථානයට ගොස්, ස්වාමීන් වහන්සේලාගේ සිව්පස අවශ්‍යතා සොයා බලා ඒවා පූජා කිරීමේ දී දරුවාට ප්‍රමුඛතාව දී කටයුතු කරන්න.

**නිපුණතාව 01 :** තෙරුවන ගුණ හැඳින චරිතායනය කරයි.

**නිපුණතා මට්ටම 10.1.3 :** තෙරුවනෙ හි සූවිසි ගුණ සමාලෝචනය කොට ආදර්ශ ලබා ගෙන ඒ අනුව ක්‍රියා කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව :** 02 යි.

**ඉගෙනුම් පල :**

- තෙරුවනෙහි සූවිසි ගුණ නම් කරයි.
- බෞද්ධ දරුවකු තෙරුවනෙහි ගුණ අනුව හැඩගැසිය යුතු බව පිළිගනී.
- තෙරුවන වන්දනා කරන පාඨවල සඳහන් ගුණ ඉස්මතු වන පරිදි සජ්ඣායනා කරයි.
- දෛනික ව තෙරුවන වන්දනයෙහි යෙදේ.
- සිය ක්‍රියා කලාපයෙන් ශ්‍රද්ධාව ප්‍රකට කරයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස් :**

ත්‍රිවිධ රත්නයේ ගුණ හැඳින කටයුතු කිරීම මෙම පාඩමෙන් අපේක්ෂිත ය.

**පියවර 1 :**

- බෞද්ධයකු ලෙස ඔබට මිල කළ නොහැකි රත්න මොනවාදැයි සිසුන්ගෙන් විමසමින් පහත සඳහන් කරුණු ද මතු කරමින් සාකච්ඡාවක් මෙහෙයවන්න.
  - බුද්ධ, ධම්ම, සංඝ යනුවෙන් තෙරුවන හැඳින්වෙන බව
  - බෞද්ධයකු වන්නේ තෙරුවන සරණ යාමෙන් බව
  - අප තෙරුවන ආදර්ශයට ගෙන කටයුතු කළ යුතු බව

**පියවර 2 :**

- සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් කොට ගවේෂණ පත්‍රිකා සිසුන් අතර බෙදා දී, අදාළ ක්‍රියාකාරකමෙහි සිසුන් නිරත කරවන්න.

**පියවර 3 :**

- කණ්ඩායම් අනාවරණ පන්තියට ඉදිරිපත් කරන්නට හා, ඌනපූරණ හෝ සංවර්ධනාත්මක යෝජනා සඳහා සිසුන්ට අවස්ථාව ලබා දෙමින්, පහත සඳහන් කරුණු ද මතු කරමින් සමාලෝචනයක යෙදෙන්න.
  - බෞද්ධයකු වීමේ පළමු පියවර තෙරුවන සරණ යාම මගින් සිදු වන බව
  - බුද්ධ රත්නයේ ගුණ 9ක් බව
  - ධම්ම රත්නයේ ගුණ 6ක් බව
  - සංඝරත්නයේ ගුණ 9ක් බව
  - මේ අයුරින් තෙරුවන ගුණ 24ක් ඇති බව
  - බුදුගුණ ඇසුරින් ජීවිතාදර්ශ ලබාගත හැකි බව

• දහම් ගුණ ඇසුරින් බුදු දහමේ සුවිශේෂත්වය පැහැදිලි වන බව
• සංඝරත්නය, ධර්මය ආරක්ෂා කොට පවත්වා ගෙන යාමෙන් විශාල වගකීමක් ඉටු කරන බව
• භික්ෂූන් වහන්සේලා කෙරෙහි මෛත්‍රී සහගත ව ක්‍රියා කළ යුතු බව
• සංඝ රත්නයේ ගුණ ඇසුරින් ජීවිතාදර්ශ ලබාගත හැකි බව

**ගුණාත්මක යෙදවුම් :** පොදු උපදෙස් අනුව ගුරු භවතාගේ අභිමතය පරිදි යොදා ගත හැකි ය.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

මෙම නිපුණතා මට්ටමට අදාළ ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණයන් මැන බැලීමට සුදුසු ආකාරයේ නිර්ණායක සකස් කර ගැනීමට ගුරු භවතාට නිදහස ඇත.

**ගවේෂණ පත්‍රිකාව :**

කණ්ඩායම 1. "ඉතිපිසෝ" පාඨයෙහි ඇතුළත් බුදුගුණ ඇසුරින් ජීවිතාදර්ශ ලබා ගන්නා ආකාරය පැහැදිලි කරන්න.

කණ්ඩායම 2. දහම්ගුණ ඇසුරින් බුදු දහමෙහි ඇති සුවිශේෂ බව පෙන්වා දෙන්න.

කණ්ඩායම 3. සංඝරත්නයේ ගුණ ඇසුරින් ජීවිතාදර්ශ ලබා ගන්නා ආකාරය පැහැදිලි කරන්න.

**ගෙදර පරිසරයෙන් :**

දිනපතා සුදුසු වේලාවක් වෙන් කොට පවුලේ සියලු දෙනා එකට එක් වී නිවසේ දී තෙරුවන වන්දනයෙහි යෙදෙන්න.

**නිපුණතාව 02** : ජීවන රටාව හැඩගසා ගැනීමට බෞද්ධ ඉගැන්වීම් හා ශ්‍රාවක ශ්‍රාවිකා චරිත උපයෝග කර ගනී.

**නිපුණතා මට්ටම 10.2.1**: සමථ භාවනාව හැඳින භාවනාවේ යෙදෙයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02යි.

**ඉගෙනුම් පල** :

- සමථ භාවනාව සුවිශේෂ ව විස්තර කරයි.
- සමථ භාවනාව වැඩීමෙන් සිත එකඟ කර ගත හැකි බව පිළිගනියි.
- නිවැරදි ඉරියව් පවත්වමින් සමථ භාවනාවක යෙදෙයි.
- මනා සිහියෙන් දෛනික කාර්යයන් හි යෙදෙයි.
- භාවනාව ජීවන පුරුද්දක් කර ගනියි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්** :

සමථ භාවනාව හැඳින්වීම, පුද්ගල චරිත, සතර ඉරියව් හා පූර්ව කෘත්‍ය පිළිබඳ ව අවබෝධයක් ලබා ගැනීම මෙම පාඩමෙන් අපේක්ෂිත ය.

**පියවර 1** :

- භාවනානුයෝගී ව වැඩ සිටින ආකාරයේ බුද්ධ ප්‍රතිමාවක් හෝ පින්තූරයක් සිසුන්ට පෙන්වන්න.
- පහත සඳහන් කරුණු මතු කරමින් සාකච්ඡාවක් මෙහෙය වන්න.
  - ඉදිරිපත් කරන ලද පින්තූරයෙන් දැක්වෙන ඉරියව්ව භාවනාවට වඩාත් යෝග්‍ය බව
  - භාවනා කිරීමෙන් සිත පිරිසිදු වන බව
  - සිත පිරිසිදු වීමෙන් ගත ද සංවර භාවයට පත් වන බව
  - භාවනා වැඩීම සඳහා නිවැරදි ඉරියව් පවත්වා ගත යුතු බව

**පියවර 2** :

- සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් කොට ගවේෂණ පත්‍රිකා සිසුන් අතර බෙදා දී, අදාළ ක්‍රියාකාරකමෙහි සිසුන් නිරත කරවන්න.

**පියවර 3** :

- කණ්ඩායම් අනාවරණ පන්තියට ඉදිරිපත් කරන්නට හා, ඌනපූරණ හෝ සංවර්ධනාත්මක යෝජනා සඳහා සිසුන්ට අවස්ථාව ලබා දෙමින්, පහත සඳහන් කරුණු ද මතු කරමින් සමාලෝචනයක යෙදෙන්න.
  - සමථ භාවනා ක්‍රමය බුද්ධ කාලයට පෙර ද පැවති බව
  - සමථ භාවනාවේ කර්මස්ථාන 40ක් බුදුදහමේ දක්වා ඇති බව
  - භාවනාවේ දී සැලකිය යුතු පුද්ගල චරිත හයක් ඇති බව
  - සතර ඉරියව්වෙන් ම භාවනා වැඩිය හැකි බව

- භාවනා වැඩීමේ දී අනුගමනය කළ යුතු පූර්ව කෘත්‍යයන් ඇති බව
- සමථ භාවනාවෙන් පංච නීවරණ යටපත් වන බව
- පෙර පෝදා වැඩ සටහනක දී හෝ ආසන්න දිනයක දී විහාරස්ථානය හෝ පාසල් බුදුමැදුර සමීපයෙහි සමථ භාවනාවක නිරත විය හැකි බව

**ගුණාත්මක යෙදවුම් :** පොදු උපදෙස් අනුව ගුරු භවතාගේ අභිමතය පරිදි යොදා ගත හැකි ය.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**
මෙම නිපුණතා මට්ටමට අදාළ ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණයන් මැන බැලීමට සුදුසු ආකාරයේ නිර්ණායක සකස් කර ගැනීමට ගුරු භවතාට නිදහස ඇත.

**ගවේෂණ පත්‍රිකාව :**

කණ්ඩායම 1. සමථ භාවනාව හා පංච නීවරණ කෙටියෙන් හඳුන්වන්න.

කණ්ඩායම 2. භාවනාවේ දී හැඳින ගත යුතු පුද්ගල චරිත පිළිබඳව කෙටියෙන් හඳුන්වන්න.

කණ්ඩායම 3. භාවනා වැඩීමේ දී අනුගමනය කළ හැකි ඉරියව් සතර පිළිබඳ හැඳින්වීමක් කරන්න.

කණ්ඩායම 4. භාවනාවේ පූර්ව කෘත්‍ය ලෙස සිදු කරන ක්‍රියාකාරකම් කෙටියෙන් දක්වන්න.

**ගෙදර පරිසරයෙන් :**

i. භාවනා ඉරියව්වේ වැඩ සිටින භික්ෂු නමක් හෝ සමූහයක් දැක්වෙන ඡායාරූපයක් නිවසේ බිත්තියක රඳවන්න.

ii. දෙමාපියන් ඉඳහිට හෝ භාවනාවට වාඩිවෙන්න.

iii. භාවනාවේ අනුසස් දරුවාට කියා දී දරුවා ද එක් ව භාවනා කරන්න.

**නිපුණතාව 02** : ජීවන රටාව හැඩගසා ගැනීමට බෞද්ධ ඉගැන්වීම් හා ශ්‍රාවක ශ්‍රාවිකා චරිත උපයෝග කර ගනියි.

**නිපුණතා මට්ටම 10.2.2**: විපස්සනා භාවනාව ප්‍රගුණ කොට ජීවිතය යථාවබෝධයෙන් දැකීමට ක්‍රියා කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02 යි.

**ඉගෙනුම් පල** :

- විපස්සනා භාවනාව ප්‍රගුණ කළ යුතු ආකාරය පැහැදිලි කරයි.
- විපස්සනා භාවනාව නිර්වාණාවබෝධය සඳහා හේතු වන බව පිළිගනී.
- විපස්සනා භාවනාව වැඩීමේ දී අනුගමනය කළ යුතු ක්‍රියා මාර්ග පිළිබඳ උපදෙස් පත්‍රිකාවක් සකස් කරයි.
- දෛනික ජීවිතයේ සිදුවීම් විශ්ලේෂණාත්මක ව දකියි.
- වෙනස් වීමට ඔරොත්තු දෙයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්** :

විපස්සනා භාවනාව පිළිබඳ විධිමත් දැනුමක් මෙම පාඩමෙන් අපේක්ෂිත ය.

**පියවර 1** :

- "අනිච්චා වත සංඛාරා ......." යනුවෙන් ආරම්භ වන ගාථාව ලියූ පුවරුවක් සිසුන්ට ප්‍රදර්ශනය කරන්න.
- එම ගාථාව සිසුන් සමග සජ්ඣායනා කරන්න.
- පහත සඳහන් කරුණු මතු කරමින් සාකච්ඡාවක් මෙහෙයවන්න.
  - මෙම ගාථාව අවමඟුල් අවස්ථාවන්හි දී ස්වාමීන් වහන්සේලා සජ්ඣායනා කරන බව
  - මෙම ගාථාවෙන් ඇති වීම, හා නැති වීම පිළිබඳ ව ඉගැන්වෙන බව
  - මෙම තත්වය පැහැදිලි කර ගත හැක්කේ විපස්සනා භාවනාවෙන් බව
  - විදර්ශනා භාවනාව බුදුරජාණන් වහන්සේ අනාවරණය කර ගත් භාවනාවක් බව

**පියවර 2** :

- සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් කොට ගවේෂණ පත්‍රිකා සිසුන් අතර බෙදා දී, අදාළ ක්‍රියාකාරකමෙහි සිසුන් නිරත කරවන්න.

**පියවර 3** :

- කණ්ඩායම් අනාවරණ පන්තියට ඉදිරිපත් කරන්නට හා, ඌනපූරණ හෝ සංවර්ධනාත්මක යෝජනා සඳහා සිසුන්ට අවස්ථාව ලබා දෙමින්, පහත සඳහන් කරුණු ද මතු කරමින් සමාලෝචනයක යෙදෙන්න.
  - විදර්ශනා භාවනාව විශේෂ වූ භාවනාවක් බව
  - ප්‍රඥා භාවනාව හා තිලකුණු භාවනාව යනු විදර්ශනා භාවනාව හඳුන්වන තවත් නම් බව

- ත්‍රිලක්ෂණයට ඇතුළත් අංග වෙන් වෙන් ව පැහැදිලි කළ හැකි බව
- ත්‍රිලක්ෂණය දැකීම භාවනාවක් හැටියට වැඩිය හැකි බව
- ත්‍රිලක්ෂණය එකිනෙකට සම්බන්ධ වී ඇති බව
- ත්‍රිලක්ෂණ භාවනාව ලෝකෝත්තර මට්ටමින් නිවන අරමුණු කොට ගෙන වඩන්නක් බව
- ත්‍රිලක්ෂණය හැදෑරීමෙන් සාර්ථක ජීවිතයකට මග පෙන්වන බව
- ත්‍රිලක්ෂණ භාවනාවෙන් යථාවබෝධය ලද හැකි බව

**ගුණාත්මක යෙදවුම් :** පොදු උපදෙස් අනුව ගුරු භවතාගේ අභිමතය පරිදි සොයා ගත හැකි ය.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

මෙම නිපුණතා මට්ටමට අදාළ ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණයන් මැන බැලීමට සුදුසු ආකාරයේ නිර්ණායක සකස් කර ගැනීමට ගුරු භවතාට නිදහස ඇත.

**ගවේෂණ පත්‍රිකාව :**

කණ්ඩායම 1. අනිත්‍ය , දුක්ඛ,අනාත්ම යන ලක්ෂණ තුන එකිනෙකට සම්බන්ධ වන්නේ කෙසේදැයි පෙන්වා දෙන්න.

කණ්ඩායම 2. ත්‍රිලක්ෂණයට යටත් ලෝකයෙහි සාර්ථක ජීවිතයක් ගත කිරීම සඳහා ඔබ සූදානම් විය යුත්තේ කෙසේදැයි පැහැදිලි කරන්න.

කණ්ඩායම 3. ත්‍රිලක්ෂණ භාවනාව වඩන ආකාරය දැක්වෙන උපදෙස් පත්‍රිකාවක් සකස් කරන්න.

**ගෙදර පරිසරයෙන් :**

ඉක්මනින් මල් හටගන්නා මල් පැලයක් තෝරා එය දරුවා සමග එක්ව රෝපණය කරන්න. පොහොර, වතුර යොදමින් ගසෙහි වැඩීමේ අවස්ථා දරුවා සමග නිරීක්ෂණය කරන්න. වෙනස්වීම, අර්ථවත් ව යොදාගත හැකි බවත් එහි සොඳුරු අවස්ථා පමණක් දැඩි ව ගෙන නතරවීම දුකක් බවත් සරල ව පහදා දෙන්න.

**නිපුණතාව 02** : ජීවන රටාව හැඩගසා ගැනීමට බෞද්ධ ඉගැන්වීම් හා ශ්‍රාවක ශ්‍රාවිකා චරිත උපයෝග කර ගනියි.

**නිපුණතා මට්ටම 10.2.3**: ශ්‍රාවක ශ්‍රාවිකා චරිත ඇසුරින් ජීවිතාදර්ශ ලබාගෙන තම දිවිය සාර්ථක කර ගනියි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02 යි.

**ඉගෙනුම් පල** :

- වැලිවිට සංඝරාජ මාහිමියන්ගෙන් හා දුටුගැමුණු රජතුමාගෙන් සිදු වූ සමාජ මෙහෙවර පැහැදිලි කරයි.
- මෙම චරිතවලින් ජීවිතාදර්ශ ලැබිය හැකි බව පිළිගනියි.
- මෙම චරිතවලට ආරෝපණය වී කතා කරයි.
- ආදර්ශවත් චරිත පිළිබඳ සොයා බලයි.
- අභිමානයක් ඇති කර ගත හැකි පරිදි තම චරිතය සංවර්ධනය කර ගනියි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්** :

වැලිවිට සරණංකර සංඝරාජ මාහිමි හා දුටුගැමුණු රජතුමා පිළිබඳ අධ්‍යයනයක් මෙම පාඩමෙන් අපේක්ෂිත ය.

**පියවර 1** :

පහත සඳහන් කරුණු මතු කරමින් සාකච්ඡාවක් මෙහෙයවන්න.

- සරණංකර සංඝරාජ මාහිමි හා දුටුගැමුණු රජු ශාසනික හා ජාතික වශයෙන් මහත් මෙහෙවරක් කළ බව
- වැලිවිට අසරණ සරණ සරණංකර සංඝරාජ මාහිමි නූතන ශාසනික පුනරුදයට පුරෝගාමී වූ බව
- දුටු ගැමුණු රජ ශ්‍රී ලංකාවේ වැදගත් කාර්ය භාරයක් ඉටු කළ අයෙකු බව
- මෙවැනි ශ්‍රේෂ්ඨ චරිත ඇසුරින් ලබාගත හැකි ජීවිතාදර්ශ මොනවාදැයි සොයා බැලිය යුතු බව

**පියවර 2** :

- සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් කොට ගවේෂණ පත්‍රිකා සිසුන් අතර බෙදා දී, අදාළ ක්‍රියාකාරකමෙහි සිසුන් නිරත කරවන්න.

**පියවර 3** :

- කණ්ඩායම් අනාවරණ පන්තියට ඉදිරිපත් කරන්නට හා, ඌනපූරණ හෝ සංවර්ධනාත්මක යෝජනා සඳහා සිසුන්ට අවස්ථාව ලබා දෙමින්, පහත සඳහන් කරුණු ද මතු කරමින් සමාලෝචනයක යෙදෙන්න.
  - වැලිවිට අසරණ සරණ සරණංකර සංඝරාජ මාහිමියන් ගිලිහී ගිය ශාසනික ප්‍රබෝධය නැවත ඇති කිරීමට උද්යෝගයෙන් ධර්ම ශාස්ත්‍රීය කටයුතුවල පුරෝගාමී වු බව

- වැලිවිට සරණංකර සංඝරාජ මාහිමිගෙන් උදාර ආගමික හා ශාසනික මෙහෙවරක් සිදු වූ බව (සිල්වත් සමාගම ආරම්භ කිරීම, පරිහානියට පත්ව තිබූ උපසම්පදාව ප්‍රතිෂ්ඨාපනය කිරීම, ශාස්ත්‍රීය පොත පත රචනා කිරීම)
- දුටුගැමුණු රජතුමා කුඩා කල සිට ම රට දැය සමය වෙනුවෙන් හැඟීමෙන් කටයුතු කළ බව
- දුටුගැමුණු රජතුමා රට එක්සේසත් කළ බව
- දුටුගැමුණු රජතුමා ආගමික චිරස්ථිතිය පිණිස වෙහෙර විහාර රැසක් ඉදි කළ බව
- දුටුගැමුණු රජතුමා මානව හිතවාදී අයෙකු බව
- වැලිවිට සරණංකර සංඝරාජ මාහිමිගේ සහ දුටුගැමුණු රජතුමාගේ චරිතවලින් ජීවිතාදර්ශ රැසක් ලබා ගත හැකි බව

**ගුණාත්මක යෙදවුම් :** පොදු උපදෙස් අනුව ගුරු භවතාගේ අභිමතය පරිදි යොදා ගත හැකි ය.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

මෙම නිපුණතා මට්ටමට අදාළ ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණයන් මැන බැලීමට සුදුසු ආකාරයේ නිර්ණායක සකස් කර ගැනීමට ගුරු භවතාට නිදහස ඇත.

**ගවේෂණ පත්‍රිකාව :**

කණ්ඩායම 1. වැලිවිට සරණංකර සංඝරාජ මාහිමි පිළිබඳ පහත සඳහන් ශීර්ෂ යටතේ කරුණු ගොනු කරන්න.

- මූලික තොරතුරු, ශාසනික සේවය, ශාස්ත්‍රීය සේවය

.

කණ්ඩායම 2. දුටුගැමුණු රජතුමා පිළිබඳ පහත සඳහන් ශීර්ෂ යටතේ කරුණු ගොනු කරන්න.

- මූලික තොරතුරු, ජාතික ආගමික මෙහෙවර, ලබාගත හැකි ආදර්ශ

**ගෙදර පරිසරයෙන් :**

ආදර්ශවත් චරිත කථා දෙමාපියන් සහ වැඩිහිටියන් මගින් සතියකට එකක්වත් වන සේ දරුවාට කියා දෙන්න.

**නිපුණතාව 02 :** ජීවන රටාව හැඩගසා ගැනීමට බෞද්ධ ඉගැන්වීම් හා ශ්‍රාවක ශ්‍රාවිකා චරිත උපයෝග කර ගනියි.

**නිපුණතා මට්ටම 10.2.4:** ධම්මපද ගාථා ඇසුරින් ආදර්ශ ලබා ගෙන ජීවිතය සාර්ථක කර ගැනීමට කටයුතු කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව : 02 යි.**

**ඉගෙනුම් පල :**

- "අචරිත්වා බ්‍රහ්මචරියං" සහ "උට්ඨානවතෝ සතිමතෝ" යන ධම්මපද ගාථාවල සරල අදහස පැහැදිලි කරයි.
- ධම්මපද ගාථාවලින් ජීවිතාදර්ශ ලබා ගත හැකි බව පිළිගනියි.
- ගාථා නිවැරදි ව සජ්ඣායනා කරයි.
- නිසි කල නිසි වැඩෙහි යෙදෙයි.
- කාලයෙන් උපරිම ප්‍රයෝජන ලබා ගනියි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස් :**

"අචරිත්වා බ්‍රහ්ම චරියං" යන ධම්මපද ගාථා යුගලය, "උට්ඨානවතෝ සතිමතෝ" යන ධම්මපද ගාථාව සහ එහි තේරුම පිළිබඳ දැනුම ලබා ගැනීම මෙම පාඩමෙන් අපේක්ෂිත ය.

**පියවර 1 :**

- බෞද්ධයාගේ අත්පොත ලෙස සැලකෙන්නේ කුමක්දැයි විමසා පහත සඳහන් කරුණු ද මතු කරමින් සාකච්ඡාවක් මෙහෙයවන්න.
    - ධම්මපදය බෞද්ධයාගේ අත් පොත ලෙස හැඳින්වෙන බව
    - බුදු දහමේ සාරවත් ඉගැන්වීම් රැසක් ධම්මපද ගාථාවල ඇතුළත් බව
    - උපදේශ කෘතියක් ලෙස ධම්ම පදයෙන් ජීවිතාදර්ශ රැසක් ලබාගත හැකි බව

**පියවර 2 :**

- සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් කොට ගවේෂණ පත්‍රිකා සිසුන් අතර බෙදා දී, අදාළ ක්‍රියාකාරකමෙහි සිසුන් නිරත කරවන්න.

**පියවර 3 :**

- කණ්ඩායම් අනාවරණ පන්තියට ඉදිරිපත් කරන්නට හා, ඌනපූරණ හෝ සංවර්ධනාත්මක යෝජනා සඳහා සිසුන්ට අවස්ථාව ලබා දෙමින්, පහත සඳහන් කරුණු ද මතු කරමින් සමාලෝචනයක යෙදෙන්න.
    - ධම්මපදය ඛුද්දක නිකායට අයත් බව
    - ධම්මපදය වග්ග 26කින් හා ගාථා 423කින් යුක්ත බව
    - ධම්මපදය උපදේශාත්මක අත් පොතක් බව

- තුරුණු වියේ ප්‍රමාදය පසුකාලීන පසුතැවීමට හේතු වන බව
- උත්සාහය, මනා සිහිය, නිවැරදි ක්‍රියා, විමර්ශනශීලිත්වය, සංවරය, දැහැමි ජීවිතය. අප්‍රමාදය යන කරුණු පුද්ගලයකුගේ කීර්තිය වැඩීමට හේතු වන බව
- අදාළ ගාථාවන්ගෙන් ජීවිතාදර්ශ රැසක් ලැබිය හැකි බව
- මෙම ආදර්ශ අනුව කටයුතු කිරීමෙන් සාර්ථක ජීවිතයක් ගත කළ හැකි බව

**ගුණාත්මක යෙදවුම් :** පොදු උපදෙස් අනුව ගුරු භවතාගේ අභිමතය පරිදි යොදා ගත හැකි ය.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

මෙම නිපුණතා මට්ටමට අදාළ ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණයන් මැන බැලීමට සුදුසු ආකාරයේ නිර්ණායක සකස් කරගැනීමට ගුරු භවතාට නිදහස ඇත.

**ගවේෂණ පත්‍රිකාව :**

කණ්ඩායම 1. ධම්මපද ගාථා තුන නිවැරදි ව සජ්ඣායනා කොට එහි නිදාන කථාව හා සරල අදහස දක්වන්න.

කණ්ඩායම 2. "අචරිත්වා බ්‍රහ්ම චරියං" යන ධම්මපද ගාථා දෙකෙහි අදහසට අනුව තරුණ ජීවිතයක් සාර්ථක කර ගැනීමට අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ග නිදසුන් සහිත ව ඉදිරිපත් කරන්න.

කණ්ඩායම 3. "උට්ඨානවතෝ සතිමතෝ" යන ගාථාවේ දැක්වෙන කරුණු අනුව කටයුතු කිරීමෙන් පුද්ගලයකු සාර්ථකත්වයට පත් වන ආකාරය පෙන්වා දෙන්න.

**ගෙදර පරිසරයෙන් :**

- ගෙමිදුලෙහි හෝ ගෙවත්තෙහි එළවළු පැලයක් හෝ එළවළු පාත්තියක් සැකසීමට, නඩත්තු කිරීමට දරුවා උනන්දු කරවන්න. (උදා. මිරිස් පැලයක් තරම්වත්)
- ඒවායේ මල්, එල හට ගැනෙන විට දරුවාගේ ක්‍රියාව ඉහළින් අගයා ඒවා මිල දී ගැනීමට හෝ කුඩා ත්‍යාගයක් පිරිනැමීමට හෝ කටයුතු කරන්න.

**නිපුණතාව 03 :** බෞද්ධ සාරධර්ම අගය කරමින් පිළිපදියි.
**නිපුණතා මට්ටම 10.3.1:** සීලය සුරැකීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු දැන ක්‍රියා කරයි.
**කාලච්ඡේද සංඛ්‍යාව :** 02 යි.

**ඉගෙනුම් පල :**

- සීලයෙහි ආනිසංස පැහැදිලි කරයි.
- සීලයෙහි පිහිටා කටයුතු කිරීමට කැමැත්ත පළ කරයි.
- උදැසන රැස්වීමට සුදුසු, සීලයෙහි අගය පැහැදිලි කෙරෙන කථා පිටපතක් සකස් කරයි.
- වැඩිහිටියන්ට කීකරු වෙයි.
- සුචරිතවත් ජීවිතයක් ගත කරයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස් :**

සීලයේ ආනිශංස සාකච්ඡා කිරීම මෙම පාඩමෙන් අපේක්ෂිත ය.

**පියවර 1 :**

- පුප්ඵ ගන්ධ ජාතකය සරල ව කෙටියෙන් සිසුන්ට ඉදිරිපත් කර,
- පහත සඳහන් කරුණු ද මතු කරමින් සාකච්ඡාවක් මෙහෙයවන්න.
    - සිල්වතකු කුඩා වූ හෝ වරදක් සිදු නොකළ යුතුය යන්න අදාළ ජාතක කථාවෙන් පැවසෙන බව
    - සිල්වත් වීම යනු කායික හා වාචසික සංවරය බව
    - සිල්වත් වීමෙන් සැලසෙන ආනිසංස රැසක් ඇති බව

**පියවර 2 :**

- සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් කොට ගවේෂණ පත්‍රිකා සිසුන් අතර බෙදා දී, අදාළ ක්‍රියාකාරකමෙහි සිසුන් නිරත කරවන්න.

**පියවර 3 :**

- කණ්ඩායම් අනාවරණ පන්තියට ඉදිරිපත් කරන්නට හා, ඌනපූරණ හෝ සංවර්ධනාත්මක යෝජනා සඳහා සිසුන්ට අවස්ථාව ලබා දෙමින්, පහත සඳහන් කරුණු ද මතු කරමින් සමාලෝචනයක යෙදෙන්න.
    - සිල්වත් වීමෙන් ලැබෙන ප්‍රධාන ප්‍රයෝජන පහක් බුදු දහමේ ඉගැන්වෙන බව
    - සිල්වත් වීමෙන් කායික හා මානසික සංවර්ධනය සලසා ගත හැකි බව
    - සිල්වත් වීමෙන් පුද්ගලයෙකුට සමාජ සංවර්ධනය සලසා ගත හැකි බව
    - ධනය උපයා ගැනීමට සිල්වත් වීම බාධාවක් නොවන බව
    - පොහොය දිනට පමණක් සීමා නොවී සීලය දෛනික ජීවිතයේ කොටසක් බවට පත්කර ගත යුතු බව

**ගුණාත්මක යෙදවුම්** : පොදු උපදෙස් අනුව ගුරු භවතාගේ අභිමතය පරිදි යොදා ගත හැකි ය.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්** :

මෙම නිපුණතා මට්ටමට අදාළ ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණයන් මැන බැලීමට සුදුසු ආකාරයේ නිර්ණායක සකස් කර ගැනීමට ගුරු භවතාට නිදහස ඇත.

**ගවේෂණ පත්‍රිකාව** :

කණ්ඩායම 1. සිල්වත් වීමෙන් ලැබෙන පොදු ආනිසංස පන්තියට ඉදිරිපත් කිරීමට සූදානම් කරන්න.

කණ්ඩායම 2. සිල්වත් වීමෙන් කායික මානසික සංවර්ධනය සැලසෙන ආකාරය සාකච්ඡා කර සටහන් කරන්න.

කණ්ඩායම 3. සිල්වත් වීමෙන් පුද්ගලයෙකුගේ සමාජ ජීවිතය සංවර්ධනය කරගත හැකි ආකාරය ලියා දක්වන්න.

කණ්ඩායම 4. "සිල්වත් වීම ධනෝපායනයට බාධාවක් නොවේ." මෙම අදහස සනාථ කිරීමට ඔබ දක්වන කරුණු මොනවාද?

**ගෙදර පරිසරයෙන්** :

ආහාර අනුභවයේ දී නිශ්ශබ්ද ව ද, ගෙදර කටයුතුවල දී අනවශ්‍ය කලබැගෑනි නොවන අයුරින් ද දෙමාපියන් ආදර්ශවත් ව දරුවාගේ ගති පැවතුම් සන්සුන් කරගන්න.

**නිපුණතාව 03 :** බෞද්ධ සාරධර්ම අගය කරමින් පිළිපදියි.

**නිපුණතා මට්ටම 10.3.2:** සදිසා නමස්කාරය ඇසුරින් තම යුතුකම් හැඳින සමාජ යුතුකම් ඉටු කිරීමට ක්‍රියා කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව :** 02 යි.

**ඉගෙනුම් පල :**

- සදිසාවෙන් දැක්වෙන යුතුකම් හා වගකීම් පැහැදිලි කරයි.
- තම යුතුකම් ඉටුකිරීමට සැලකිලිමත් වෙයි.
- සදිසාවන්හි දැක්වෙන යුතුකම් "ඊ" සටහනකින් නිරූපණය කරයි.
- සමාජ සබඳතාවල දී සහකම්පනයෙන් කටයුතු කරයි..
- යහපත් සමාජ සබඳතා ගොඩනගා ගනියි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස් :**

සිගාලෝවාද සූත්‍රයේ සඳහන් සදිසා නමස්කාරය පිළිබඳ අවබෝධයක් ලැබීම මෙම පාඩමෙන් අපේක්ෂිත ය.

**පියවර 1 :**

- සිගාලෝවාද සූත්‍රයේ දැක්වෙන "මාතා පිතා දිසා පුබ්බා ... "ආදී ගාථා නිවැරදි ව සිසුන් සමග සජ්ඣායනය කරන්න.
- පහත සඳහන් කරුණු ද මතු කරමින් සාකච්ඡාවක් මෙහෙයවන්න.
  - මෙම ගාථා සිගාලෝවාද සූත්‍රයෙන් උපුටා ගෙන ඇති බව
  - බුදුරජාණන් වහන්සේ මෙම ගාථා සිගාලක ගෘහපතියාට දේශනා කළ බව
  - පුද්ගලයකු ප්‍රායෝගික ව කළ යුතු යුතුකම් දැක්වෙන සමාජ කණ්ඩායම් හයක් ගාථාවෙන් පැවසෙන බව

**පියවර 2 :**

- සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් කොට ගවේෂණ පත්‍රිකා සිසුන් අතර බෙදා දී, අදාළ ක්‍රියාකාරකමෙහි සිසුන් නිරත කරවන්න.

**පියවර 3 :**

- කණ්ඩායම් අනාවරණ පන්තියට ඉදිරිපත් කරන්නට හා, ඌනපූරණ හෝ සංවර්ධනාත්මක යෝජනා සඳහා සිසුන්ට අවස්ථාව ලබා දෙමින්, පහත සඳහන් කරුණු ද මතු කරමින් සමාලෝචනයක යෙදෙන්න.
  - සදිසාවල සමාජ කණ්ඩායම් 6කට අයත් යුතුකම් හා වගකීම් අන්තර්ගත බව
  - තම යුතුකම් හා වගකීම් ඉටුකිරීම තුළ ම සිය අයිතිවාසිකම් සුරැකෙන බව
  - යුතුකම් හා වගකීම් සෑම පුද්ගලයෙකුගේ ම දෛනික ජීවිතය හා බැඳී පවතින බව

- යුතුකම් ඉටුකිරීමෙන් යහපත් සමාජ සබඳතා ගොඩනැගෙන බව
- සමාජ අන්තර් ක්‍රියාවන්හි යුතුකම් හා වගකීම් තක්සේරු කළ හැකි බව

**ගුණාත්මක යෙදවුම්** : පොදු උපදෙස් අනුව ගුරු භවතාගේ අභිමතය පරිදි යොදා ගත හැකි ය.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

මෙම නිපුණතා මට්ටමට අදාළ ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණයන් මැන බැලීමට සුදුසු ආකාරයේ නිර්ණායක සකස් කර ගැනීමට ගුරු භවතාට නිදහස ඇත.

**ගවේෂණ පත්‍රිකාව** :

කණ්ඩායම 1. මව් පිය, දූ -දරු, ගුරු - ශිෂ්‍ය, ස්වාමි - භාර්යා, මිතුරු - මිතුරු, සේව්‍ය - සේවක, ගිහි - පැවිදි යන සමාජ කොට්ඨාසවල යුතුකම් පෙළගස්වන්න.

කණ්ඩායම 2. කාලීන සිදුවීම් අධ්‍යයනය කොට යහපත් සමාජ පැවැත්මකට සදිසා යුතුකම් බලපාන ආකාරය පැහැදිලි කරන්න.

කණ්ඩායම 3. තම යුතුකම් හා වගකීම් මැනවින් ඉටු කිරීමෙන් යහපත් සමාජ සබඳතා ගොඩනැගෙන ආකාරය පෙන්වා දෙන්න.

**ගෙදර පරිසරයෙන්** :

කොතැනක දී හෝ යුතුකම් ඉටු කෙරෙන අවස්ථා නිරීක්ෂණය කර සාධු චර්යා පොතෙහි සටහන් තබා දෙමාපිය අනුමැතිය ලබා ගෙන විෂය භාර ගුරු භවතාට නිරන්තරයෙන් ඉදිරිපත් කරන්න.

**නිපුණතාව 04** : සුසමාහිත සමබර පෞරුෂයක් ගොඩනගා ගැනීමට කටයුතු කරයි.

**නිපුණතා මට්ටම 10.4.1**: වැරදි බහුල සමාජයක ඉන් මිදී නිවැරදි ජීවිතයක් ගත කළ හැකි බව පිළිගෙන ඒ අනුව ක්‍රියා කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02 යි.

**ඉගෙනුම් පල** :

- පද්මාකාර ජීවිතය යනු කුමක්දැ යි පැහැදිලි කරයි.
- පද්මාකාර ජීවිතය අගය කරයි.
- පද්මාකාර ජීවිතයක ලක්ෂණ ලැයිස්තු ගත කරයි.
- වැරදි බහුල සමාජයක ඉන් මිදී යහපත වෙනුවෙන් කටයුතු කරයි.
- චරිත පාරිශුද්ධිය රැක ගැනීම සඳහා කටයුතු කරයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්** :

පද්මාකාර ජීවිතයේ ඇති වැදගත්කම මෙම පාඩමෙන් සාකච්ඡා කෙරේ.

**පියවර 1** :

- "පුණ්ඩරීකං යථා වග්ගු" ගාථාව ලියූ පුවරුව හා එහි අදහස ලියූ පුවරුව ප්‍රදර්ශනය කරන්න.
- ගාථාව සිසුන් සමග සජ්ඣායනා කරන්න.
- පහත සඳහන් කරුණු මතු කරමින් සාකච්ඡාවක් මෙහෙයවන්න.
  - මෙහි ඉදිරිපත් කරන ලද ගාථාව ද්‍රෝණ සූත්‍රයට අයත් බව
  - ගාථාවෙන් පද්මාකාර ජීවිතය පිළිබඳ ව පැවසෙන බව
  - පද්මාකාර ජීවිතයක් ගත කරන්නේ කෙසේ දැයි සොයා බැලිය යුතු බව

**පියවර 2** :

- සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් කොට ගවේෂණ පත්‍රිකා සිසුන් අතර බෙදා දී, අදාළ ක්‍රියාකාරකමෙහි සිසුන් නිරත කරවන්න.

**පියවර 3** :

- කණ්ඩායම් අනාවරණ පන්තියට ඉදිරිපත් කරන්නට හා ඌනපූරණ හෝ සංවර්ධනාත්මක යෝජනා සඳහා සිසුන්ට අවස්ථාව ලබා දෙමින් පහත සඳහන් කරුණු ද මතු කරමින් සමාලෝචනයක යෙදෙන්න.
  - බුදු සිරිතෙන් පද්මාකාර ජීවිතය පිළිබිඹු වන බව
  - "යථා සංඛාර ධානස්මිං, ඒවං සංඛාර භූතේසු , සුසුඛං වත ජීවාම" යනුවෙන් ආරම්භ වන ගාථාවල අදහස්වලින් පද්මාකාර ජීවිතය පිළිබඳ පැහැදිලි වන බව
  - සල්ලේඛ ප්‍රතිපදාවෙන් අර්ථවත් වන්නේ ද පද්මාකාර ජීවිතය බව
  - විවිධ සමාජ අවස්ථාවල දී බුදුරජාණන් වහන්සේගේ පද්මාකාර ජීවිතයෙන් තම ජීවිතයට ආදර්ශ ලබා ගෙන කටයුතු කළ යුතු බව

**ගුණාත්මක යෙදවුම් :** පොදු උපදෙස් අනුව ගුරු භවතාගේ අභිමතය පරිදි යොදා ගත හැකි ය.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

මෙම නිපුණතා මට්ටමට අදාළ ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණයන් මැන බැලීමට සුදුසු ආකාරයේ නිර්ණායක සකස් කර ගැනීමට ගුරු භවතාට නිදහස ඇත.

**ගවේෂණ පත්‍රිකාව :**

කණ්ඩායම 1. බුදු සිරිතෙන් පද්මාකාර ජීවිතය මූර්තිමත් වන ආකාරය පෙන්වා දෙන්න.

කණ්ඩායම 2. ශිෂ්‍ය ජීවිතය හා ගෘහ ජීවිතය පද්මාකාර ව ගත කළ හැකි අයුරු විස්තර කරන්න.

කණ්ඩායම 3. බාහිර සමාජය හා සම්බන්ධ ජීවිතය පද්මාකාර ව ගත කළ හැකි අයුරු විස්තර කරන්න.

**ගෙදර පරිසරයෙන් :**

උපාය කුසලතාව යොදා ගනිමින් නුසුදුසු ක්‍රියාවන්ගෙන් වැළකීමට කටයුතු කර, ඒ පිළිබඳ දරුවන්ට පහදා දෙමින් නිවැරදි ක්‍රියාවන්හි නිරතවීමට දරුවා උත්සාහවත් කරන්න.

**නිපුණතාව 05** : ශ්‍රී ලාංකික බෞද්ධ අනන්‍යතාව සුරකිමින් සාමයෙන් හා සහජීවනයෙන් ක්‍රියා කරයි.

**නිපුණතා මට්ටම 10.5.1**: බුදු දහමෙන් ගොඩනගා ගත් අනන්‍යතාව දෛනික ජීවිතයේ දී ප්‍රදර්ශනය කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02 යි.

**ඉගෙනුම් පල** :

- චාරිත්‍ර වාරිත්‍ර පැහැදිලි කරයි.
- ආපදාපන්න අවස්ථාවල දී සහයෝගයෙන් ක්‍රියා කළ යුතු බව පිළිගනියි.
- පොදු දේපොළ සුරැකීමට අනුගමනය කරන ක්‍රියාමාර්ග ලැයිස්තුගත කරයි.
- අන්‍යාගමික මතවලට ද ගරු කරමින් සහයෝගයෙන් කටයුතු කරයි.
- පොදු මතයන්ට ගරු කරමින් දැහැමි ජීවිතයක් ගතකරයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්** :

අන්‍යාගමික ඇසුර හා සිද්ධස්ථාන ඇසුර, රැකීරක්ෂා කටයුතු, අවුරුදු චාරිත්‍ර, ආපදාපන්න අවස්ථාවල දී කටයුතු කිරීම, පොදු දේපොල පරිහරණය පිළිබඳ අධ්‍යයනය මෙම පාඩමෙන් අපේක්ෂිත ය.

**පියවර 1** :

- බක් මාසයේ පරිසරයේ ඇති වන වෙනස්කම් පිළිබඳ සිසුන් සමග සාකච්ඡා කරන්න.
- පහත සඳහන් කරුණු මතු කරමින් සාකච්ඡාවක් මෙහෙයවන්න.
  - සිංහල හා දෙමළ අලුත් අවුරුද්ද නිසා බක් මාසය වැදගත් බව
  - අලුත් අවුරුද්ද හා බැඳුණු චාරිත්‍ර රැසක් ඇති බව
  - අලුත් අවුරුදු චාරිත්‍ර සැමරීමේ දී ජාතික ආගමික සහජීවනයෙන් ක්‍රියා කළ යුතු බව

**පියවර 2** :

- සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් කොට ගවේෂණ පත්‍රිකා සිසුන් අතර බෙදා දී, අදාළ ක්‍රියාකාරකමෙහි සිසුන් නිරත කරවන්න.

**පියවර 3** :

- කණ්ඩායම් අනාවරණ පන්තියට ඉදිරිපත් කරන්නට හා, ඌනපූරණ හෝ සංවර්ධනාත්මක යෝජනා සඳහා සිසුන්ට අවස්ථාව ලබා දෙමින්, පහත සඳහන් කරුණු ද මතු කරමින් සමාලෝචනයක යෙදෙන්න.
  - ශ්‍රී ලාංකීය සමාජය බෞද්ධ මෙන්ම විවිධ ආගම් නියෝජනය කරන බව
  - භික්ෂූන් වහන්සේලා මෙන්ම අන්‍යාගමික පූජක පක්ෂය ද ගෞරවයට පත් වූ පිරිසක් බව
  - ජීවිත අර්ථ සිද්ධියට අන්‍යාගමික බුද්ධිමත් පූජකවරුන්ගේ ඇසුර ද ඉවහල් වන බව

- අලුත් අවුරුදු චාරිත්‍ර ද පිළිපැදීම මගින් සාමූහිකත්වය, ගරුත්වය, ශ්‍රද්ධාව හා සංස්කෘතිය ආරක්ෂා වන බව
- අවුරුදු චාරිත්‍ර ජන ජීවිතයේ අවස්ථා හා බැඳී පවතින බව (පුණ්‍ය කාලය, නැකතට වැඩ ආරම්භ කිරීම, වැඩිහිටියන්ට ගෞරව දැක්වීම, අර්ථවත් ක්‍රියාකාරකම්, ශ්‍රද්ධාව, හොඳ හිත වර්ධනය කර ගැනීම, භෞතික හා ස්වාභාවික වස්තූන්ට ගරු කිරීම)
- පොදු දේපළ පරිහරණයේ දී සැලකිය යුතු වැදගත් කරුණු රැසක් ඇති බව (පාසල, ආරෝග්‍යශාලාව, පොදු ප්‍රවාහන සේවා, මහා මාර්ගය, ක්‍රීඩා පිටිය, ප්‍රජා ශාලාව ආදි)
- තීරණ ගැනීමේ දී බුද්ධිමත් ව පොදු මතයට ගරු කළ යුතු බව
- ආපදාපන්න අවස්ථාවල දී තැනට සුදුසු ආකාරයෙන් ක්‍රියා කළ යුතු බව ( සුනාමි, සුළි සුළං, නායයාම්, ජල ගැලීම්, මාර්ග අනතුරු, ගිනි ගැනීම්, වන සතුන්ගෙන් සිදුවන හානි)

**ගුණාත්මක යෙදවුම් :** පෙදු උපදෙස් අනුව ගුරු භවතාගේ අභිමතය පරිදි යොදා ගත හැකි ය.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

මෙම නිපුණතා මට්ටමට අදාළ ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණයන් මැන බැලීමට සුදුසු ආකාරයේ නිර්ණායක සකස් කර ගැනීමට ගුරු භවතාට නිදහස ඇත.

**ගවේෂණ පත්‍රිකාව :**

කණ්ඩායම 1. පාසල තුළ අන්‍යාගමික පූජක පක්ෂය සිටින්නේ නම් (නොමැති නම් සිටින්නේ යයි සිතා) ඔබ ඔවුන් වෙනුවෙන් කටයුතු කරන ආකාරය ලැයිස්තු ගත කරන්න.

කණ්ඩායම 2. සිංහල අලුත් අවුරුදු චාරිත්‍ර හා දැහැමි රැකියා ලැයිස්තු ගත කරන්න.

කණ්ඩායම 3. ආපදාපන්න අවස්ථාවක් (සුනාමි, සුළි සුළං, නාය යාම්, ගංවතුර ආදී අවස්ථා) නම් කොට ඔබ කටයුතු කරන ආකාරය ලැයිස්තු ගත කරන්න.

කණ්ඩායම 4. පොදු දේපළ පරිහරණය කරන අවස්ථා කිහිපයක් නම් කොට, එහි දී ඔබ ක්‍රියා කළ යුතු ආකාරය ලැයිස්තු ගත කරන්න.

**ගෙදර පරිසරයෙන් :**

අන්‍යාගමික පූජ්‍ය ස්ථානයක් නැරඹීමට දරුවා සමග ගොස් ගෞරවයෙන් යුතු ව එහි කටයුතු පිළිබඳ අවබෝධයක් ලබා ගන්න.

**නිපුණතාව 06** : බුදු දහමට අනුව ජීවිතය හා ලෝකය හැඳින ගෙන ප්‍රඥාවන්ත ජීවිතයක් ගත කරයි.

**නිපුණතා මට්ටම 10.6.1**: කර්මය හා කර්ම විපාක පිළිබඳ නිවැරදි දැක්මෙන් කටයුතු කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02 යි.

**ඉගෙනුම් පල** :

- කර්මය, කර්මයේ ප්‍රභේද හා එහි විපාක සංක්ෂිප්ත ව ඉදිරිපත් කරයි.
- කර්මය දෙලොව දී ම විපාක දෙන බව පිළිගනියි.
- කර්මයේ ප්‍රභේද ගැලීම් සටහනකින් දක්වයි.
- කිසියම් ක්‍රියාවක් සිදු කිරීමේ දී හොඳ නරක පිළිබඳ සැලකිලිමත් වෙයි.
- කර්ම වාදියකු ලෙස කටයුතු කරයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්** :

කර්මය, කර්මයේ ප්‍රභේද හා කර්ම විපාක පිළිබඳ ව අධ්‍යයනයක් මෙම පාඩමෙන් අපේක්ෂිත ය.

**පියවර 1** :

- සුභ මානවකයාගේ කථාව පන්තියට ඉදිරිපත් කරන්න. (චූල කම්ම විභංග සූත්‍රය)
- පහත සඳහන් කරුණු මතු කරමින් ඒ පිළිබඳ සිසුන් සමග සාකච්ඡාවක් මෙහෙයවන්න.
  - සුභ මානවකයාගේ කථා පුවතින් කර්මය හා විපාකය පිළිබඳ පැහැදිලි වන බව
  - කර්ම විපාක පිළිබඳ පැහැදිලි කෙරෙන කථා පුවත් රැසක් ඇති බව
  - සැම දෙනාට ම කර්මය පිළිබඳ අත්දැකීම් ඇති බව
  - කර්මය පිළිබඳ හැදෑරීම සාර්ථක ජීවිතයක් ගත කිරීමට හේතු වන බව

**පියවර 2** :

- සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් කොට ගවේෂණ පත්‍රිකා සිසුන් අතර බෙදා දී, අදාළ ක්‍රියාකාරකමෙහි සිසුන් නිරත කරවන්න.

**පියවර 3** :

- කණ්ඩායම් අනාවරණ පන්තියට ඉදිරිපත් කරන්නට හා, ඌනපූරණ හෝ සංවර්ධනාත්මක යෝජනා සඳහා සිසුන්ට අවස්ථාව ලබා දෙමින්, පහත සඳහන් කරුණු ද මතු කරමින් සමාලෝචනයක යෙදෙන්න.
  - කර්මය බුදු දහමට අනුව නිර්වචනය කළ හැකි බව
  - සිතා මතා නොකරන ඉබේ සිදු වන ක්‍රියා කර්ම ගණයට ඇතුළත් නොවන බව
  - බුදු දහමට අනුව සියල්ල කර්මයෙන් සිදු නොවන බව

- කාලය, පිළිවෙළ, කෘත්‍ය, විපාක දෙන ආකාරය අනුව කර්මය කොටස් කර දැක්විය හැකි බව
- කර්මයේ ප්‍රභේද කුසල අකුසල වශයෙන් වෙන් කොට දැක්විය හැකි බව
- කුසලාකුසල කර්ම විපාක ලැබීම ජීවිත අත්දැකීම් මගින් පැහැදිලි කළ හැකි බව (කුසල හෝ අකුසල)
- කර්ම විපාක පිළිගෙන කටයුතු කිරීමෙන් ජීවිතය සාර්ථක කර ගැනීමට පසුබිම සැකසෙන බව

**ගුණාත්මක යෙදවුම් :** පොදු උපදෙස් අනුව ගුරු භවතාගේ අභිමතය පරිදි යොදා ගත හැකි ය.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

මෙම නිපුණතා මට්ටමට අදාළ ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණයන් මැන බැලීමට සුදුසු ආකාරයේ නිර්ණායක සකස් කර ගැනීමට ගුරු භවතාට නිදහස ඇත.

**ගවේෂණ පත්‍රිකාව :**

කණ්ඩායම 1. කර්මයේ ප්‍රභේද ගැලීම් සටහනක් මගින් දක්වා සරල ව පැහැදිලි කරන්න.

කණ්ඩායම 2. නිදසුන් මගින් කර්මය විපාක දෙන ආකාරය පැහැදිලි කරන්න.

කණ්ඩායම 3. කර්මඵල විශ්වාස කරන අයෙකු ලෙස අනාගත ජීවන මාර්ගය තෝරා ගැනීමේ දී ඔබ ක්‍රියා කළ යුතු ආකාරය පැහැදිලි කරන්න.

**ගෙදර පරිසරයෙන් :**

දෛනික ජීවිතයේ දී දරුවා කරන යහපත් ක්‍රියා පිං පොතක ලිවීමට උපදෙස් දී ඒවා වරින් වර අධීක්ෂණය කොට, සටහන් තබා පාසලේ පන්ති භාර ගුරු භවතාට ඉදිරිපත් කරන්න.

**නිපුණතාව 06** : බුදුදහමට අනුව ජීවිතය හා ලෝකය හැඳින ගෙන ප්‍රඥාවන්ත ජීවිතයක් ගත කරයි.

**නිපුණතා මට්ටම 10.6.2:** ත්‍රිලක්ෂණ ධර්මතාව හැඳින යථාවබෝධයෙන් කටයුතු කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02 යි.

**ඉගෙනුම් පල** :

- ත්‍රිලක්ෂණ ධර්මතාව හැඳින පැහැදිලි කරයි.
- ත්‍රිලක්ෂණය ලොව පවතින සියලු ධර්මතාවලට පොදු වූවක් බව පිළිගනියි.
- අනිත්‍යතාව ප්‍රකට වන කතා පුවතක් ගොඩ නගයි.
- වෙනස් වීමට ඔරොත්තු දීමේ ශක්තිය ප්‍රදර්ශනය කරයි.
- අකම්පිත ව යථාර්ථයට මුහුණ දෙයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්** :

ත්‍රිලක්ෂණය පිළිබඳ දැනුමක් ලබා ගැනීම මෙම පාඩමෙන් අපේක්ෂිත ය.

**පියවර 1** :

- මෙහි දී පහත සඳහන් කරුණු මතු කරමින් සාකච්ඡාවක් මෙහෙයවන්න.
  - නොවෙනස් කිසිවක් ලොව නොපවතින බව උපන් සියල්ලන් ම ජීවිතයේ යථා ස්වභාවයට මුහුණ දිය යුතු බව

**පියවර 2** :

- සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් කොට ගවේෂණ පත්‍රිකා සිසුන් අතර බෙදා දී, අදාළ ක්‍රියාකාරකමෙහි සිසුන් නිරත කරවන්න.

**පියවර 3** :

- කණ්ඩායම් අනාවරණ පන්තියට ඉදිරිපත් කරන්නට හා, ඌනපූරණ හෝ සංවර්ධනාත්මක යෝජනා සඳහා සිසුන්ට අවස්ථාව ලබා දෙමින්, පහත සඳහන් කරුණු ද මතු කරමින් සමාලෝචනයක යෙදෙන්න.
  - ත්‍රිලක්ෂණ ඉගැන්වීම අනත්ත ලක්ඛණ සූත්‍රයේ පැහැදිලි ව සඳහන් වන බව
  - හේතු ප්‍රත්‍යයන්ගෙන් හටගත් සියල්ල අනිත්‍ය බව
  - අනිත්‍යතාව ත්‍රිලක්ෂණයේ පළමු අංගය බව
  - ලොව පවතින සියලු ම දේ ත්‍රිලක්ෂණයට යටත් වන බව
  - අනිත්‍ය, දුක්ඛ, අනාත්ම එකිනෙකට බැඳී ඇති බව
  - වෙනස් වීම දුක සැප දෙකෙහි ම පවතින බව
  - වෙනස්වීමට මුහුණ දීමේ දී දරා ගැනීමේ ශක්තිය ඇති කර ගැනීම වැදගත් බව
  - ත්‍රිලක්ෂණ ධර්මතාව තේරුම් ගැනීම යථාර්ථවාදී ජීවිතයක පදනම බව

**ගුණාත්මක යෙදවුම් :** පොදු උපදෙස් අනුව ගුරු භවතාගේ අභිමතය පරිදි යොදා ගත හැකි ය.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

මෙම නිපුණතා මට්ටමට අදාළ ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණයන් මැන බැලීමට සුදුසු ආකාරයේ නිර්ණායක සකස් කර ගැනීමට ගුරු භවතාට නිදහස ඇත.

**ගවේෂණ පත්‍රිකාව :**

කණ්ඩායම 1. අනිත්‍ය , දුක්ඛ, අනාත්ම යන අංග තුන එකිනෙකට සම්බන්ධ වන ආකාරය පැහැදිලි කරන්න.

කණ්ඩායම 2. වෙනස්වීම දුක සැප දෙකට ම බලපාන ආකාරය පැහැදිලි කරන්න.

කණ්ඩායම 3. ත්‍රිලක්ෂණයට අයත් ලෝකයෙහි සාර්ථක ජීවිතයක් ගත කරන ආකාරය පැහැදිලි කරන්න.

**ගෙදර පරිසරයෙන් :**

එදිනෙදා ජීවිතයේ දී අපේක්ෂිත හා අනපේක්ෂිත සිදුවීම්වල දී විඳ දරා ගැනීමේ ශක්තිය ඇති කර ගැනීමට දරුවාට මග පෙන්වන ආකාරයට නිවසේ කටයුතු කරන්න.

**නිපුණතාව 06** : බුදුදහමට අනුව ජීවිතය හා ලෝකය හැඳින ගෙන ප්‍රඥාවන්ත ජීවිතයක් ගත කරයි.

**නිපුණතා මට්ටම 10.6.3**: පටිච්ච සමුප්පාද න්‍යාය ගැටලු නිරාකරණයට භාවිත කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02 යි.

**ඉගෙනුම් පල** :

- පටිච්ච සමුප්පාද න්‍යාය දැක්වෙන මූල සූත්‍රයේ අදහස පැහැදිලි කරයි.
- සියලු ම දේ හේතුඵල සම්බන්ධතාවෙන් හටගන්නා බව පිළිගනියි.
- මූල සූත්‍රය හා "යේ ධම්මා හේතුප්පභවා ........" යන ගාථාව මතකයෙන් කියයි.
- ගැටලු නිරාකරණයේ දී එහි හේතුඵල සම්බන්ධතාව සොයා බලයි.
- පොදු ගැටලු අධ්‍යයනය කොට අන් අයට නිවැරදි ව මග පෙන්වයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්** :

මූල සූත්‍රය හා "යේ ධම්මා හේතුප්පභවා '' යන ගාථා පදනම් කර ගනිමින් පටිච්ච සමුප්පාද න්‍යාය පිළිබඳ දැනුමක් ලබා ගැනීම මෙම පාඩමෙන් අපේක්ෂිත ය.

**පියවර 1** :

- කාලීන සිදුවීම් ඇතුළත් පුවත් පත් වාර්තා උපුටන කිහිපයක් සිසුන්ට ඉදිරිපත් කරන්න.
- ඒ සම්බන්ධ ව සිසුන්ගෙන් කරුණු විමසන්න.
- පහත සඳහන් කරුණු ද මතු කරමින් සාකච්ඡාවක් මෙහෙය වන්න.
  - ඉහත සිදුවීම් සියල්ලට මුල් වූ ප්‍රධාන හේතු සහ තවත් හේතු කිහිපයක් ඇති බව
  - සෑම සිදුවීමකට ම හේතුවක් මුල් වන බව
  - බුදු දහමට අනුව මෙම ඉගැන්වීම පටිච්ච සමුප්පාද ධර්මතාව ලෙස පැහැදිලි කෙරෙන බව
  - ගැටලු නිරාකරණයට මෙම ධර්මතාව භාවිත කළ යුත්තේ කෙසේ දැයි සොයා බැලිය යුතු බව

**පියවර 2** :

- සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් කොට ගවේෂණ පත්‍රිකා සිසුන් අතර බෙදා දී, අදාළ ක්‍රියාකාරකමෙහි සිසුන් නිරත කරවන්න.

**පියවර 3** :

- කණ්ඩායම් අනාවරණ පන්තියට ඉදිරිපත් කරන්නට හා, ඌනපූරණ හෝ සංවර්ධනාත්මක යෝජනා සඳහා සිසුන්ට අවස්ථාව ලබා දෙමින්, පහත සඳහන් කරුණු ද මතු කරමින් සමාලෝචනයක යෙදෙන්න.
  - පටිච්ච සමුප්පාදය බුදු දහමේ මූලික වූත් විශිෂ්ට වූත් ඉගැන්වීමක් බව
  - මෙම න්‍යාය බුදුරජාණන් වහන්සේලා විසින් පමණක් ම ලෝකයට දේශනා කරන ලද බව

- මූල සූත්‍රය හා අදාළ ගාථාව මගින් හේතුඵල දහම සංක්ෂිප්ත ව ඉදිරිපත් කර ඇති බව
- "යෙ ධම්මා හේතුප්පභවා ..." ගාථාව උපතිස්ස පිරිවැජියාට අස්සජි මහ රහතන් වහන්සේ දේශනා කළ බව
- බුද්ධ කාලයේ සමාජයේ පැවති මිථ්‍යා දෘෂ්ටික වාදයන් පටිච්ච සමුප්පාද න්‍යායයෙන් ප්‍රතික්ෂේප වන බව
- කාලීන නිදසුන් මගින් ද හේතු ඵල සබඳතාව පැහැදිලි කළ හැකි බව
- එදිනෙදා ජීවිතයේ දී ඇතිවන්නා වූ ගැටලු හේතුඵල දහම මගින් විසඳා ගත හැකි බව

**ගුණාත්මක යෙදවුම් :** පොදු උපදෙස් අනුව ගුරු භවතාගේ අභිමතය පරිදි යොදා ගත හැකි ය.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

මෙම නිපුණතා මට්ටමට අදාළ ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණයන් මැන බැලීමට සුදුසු ආකාරයේ නිර්ණායක සකස් කර ගැනීමට ගුරු භවතාට නිදහස ඇත.

**ගවේෂණ පත්‍රිකාව :**

කණ්ඩායම 1. මූල සූත්‍රය හා "යෙ ධම්මා හේතුප්පභවා ....." යන පාලි පාඨ නිවැරදි ව ලියා අදහස පැහැදිලි කරන්න.

කණ්ඩායම 2. හේතුඵල සබඳතාවෙන් ලොව ඇති සියලු දෙය හට ගන්නා බව නිදසුන් කිහිපයකින් පැහැදිලි කරන්න.

කණ්ඩායම 3. ඔබ හඳුනා ගත් කිසියම් සුවිශේෂ ගැටලුවක් හේතුඵල දහම අනුව විසඳා ගන්නා ආකාරය පැහැදිලි කරන්න.

**ගෙදර පරිසරයෙන් :**

දෛනික ජීවිතයේ දී මුහුණ දීමට සිදු වන ගැටලු හේතුඵල දහමට අනුව විසඳා ගන්නට දරුවාට උදව් කරන්න.

**නිපුණතාව 06** : බුදුදහමට අනුව ජීවිතය හා ලෝකය හැඳින ගෙන ප්‍රඥාවන්ත ජීවිතයක් ගත කරයි.

**නිපුණතා මට්ටම 10.6.4**: ආර්ය සත්‍ය හතර නිවැරදි ව හැඳින හරවත් ජීවිතයක් ගත කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02යි.

**ඉගෙනුම් පල** :

- උතුම් ආර්ය සත්‍ය හතර පිළිබඳ පැහැදිලි විග්‍රහයක් කරයි.
- දුක හට ගැනීමට හේතුව සමුදය සත්‍යයෙන් ප්‍රකට වන බව පිළිගනියි.
- දුක්ඛ නිරෝධ ගාමිණි පටිපදා ආර්ය සත්‍යයට අයත් මධ්‍යම ප්‍රතිපදාව පිළිවෙළින් ලියා දක්වයි.
- විශ්ලේෂණාත්මක ව ගැටලු විසඳා ගනියි..
- ජීවිත අවබෝධයෙන් යුතු ව කටයුතු කරයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්** :

චතුරාර්ය සත්‍යය පිළිබඳ ඉගැන්වීම සමාලෝචනය මෙම පාඩමෙන් අපේක්ෂිත ය.

**පියවර 1** :

- දම්සක් පැවතුම් සූත්‍රයේ සඳහන් මෙම පාඨය සිසුන්ට ශ්‍රවණය කිරීමට සලස්වන්න.
  "එවං මෙ සුතං . එකං සමයං භගවා බාරාණසියං විහරති ඉසිපතනෙ
  මිගදායෙ තත්‍ර ඛො භගවා පඤ්ච වග්ගියෙ භික්ඛු ආමන්තේසි ද්වේ
  මෙ භික්ඛවෙ අන්තා පබ්බජිතෙන න සෙවිතබ්බා. යො චායං කාමෙසු
  කාමසුඛල්ලිකානුයොගො හීනො ගම්මො පොථුජ්ජනිකො අනරියො අනත්ත සංහිතො ..."
- ඒ සම්බන්ධ ව සිසුන්ගෙන් තොරතුරු විමසන්න.
- පහත සඳහන් කරුණු මතු කරමින් සාකච්ඡාවක් මෙහෙයවන්න.
  - ඉහත පාඨය දම්සක් පැවතුම් සුතුරේ (ධම්මචක්ක පවත්තන සූත්‍රයේ) ඇතුළත් වන බව
  - දම්සක් පැවතුම් සූතුරේ (ධම්මචක්ක පවත්තන සූත්‍රයේ) ඇසළ පුර පසළොස්වක පෝය දින පස්වග තවුසන් උදෙසා දේශනා කළ බව
  - දම්සක් පැවතුම් සූතුරේ (ධම්මචක්ක පවත්තන සූත්‍රයේ) චතුරාර්ය සත්‍ය ඇතුළත් වන බව
  - මෙම ඉගැන්වීම හරවත් ජීවිතයකට පදනම් කරගත හැකි බව

**පියවර 2** :

- සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් කොට ගවේෂණ පත්‍රිකා සිසුන් අතර බෙදා දී, අදාළ ක්‍රියාකාරකමෙහි සිසුන් නිරත කරවන්න.

**පියවර 3** :

- කණ්ඩායම් අනාවරණ පන්තියට ඉදිරිපත් කරන්නට හා, ඌනපූරණ හෝ සංවර්ධනාත්මක යෝජනා සඳහා සිසුන්ට අවස්ථාව ලබා දෙමින්, පහත සඳහන් කරුණු ද මතු කරමින් සමාලෝචනයක යෙදෙන්න.
  - චතුරාර්ය සත්‍යය බුදු දහමේ මූලික ඉගැන්වීමක් බව
  - චතුරාර්ය සත්‍යය යනු උතුම් වූ ඇත්ත හතර බව
  - බුදු දහමේ මූලික හරය වන චතුරාර්ය සත්‍යය, දම්සක් පැවතුම් සූත්‍ර දේශනයෙන් පැහැදිලි කර ඇති බව
  - චතුරාර්ය සත්‍යය මගින් ජීවිත ගැටලු විසඳා ගැනීමට මග පාදා ගත හැකි බව
  - දුක්ඛ ආර්ය සත්‍යයෙන් පුද්ගල දුක පිළිබඳ පැහැදිලි කරන බව
  - දුක්ඛ සමුදයාර්ය සත්‍යයෙන් දුකට හේතු වන තණ්හාව - කාම තණ්හා, භව තණ්හා, විභව තණ්හා ලෙස තුන් ආකාර වන බව
  - දුක්ඛ නිරෝධාර්ය සත්‍යයෙන් නිවන පැහැදිලි කෙරන අතර එය සෝපාධිසේස නිර්වාණය හා අනුපාදිසේස නිර්වාණය ලෙස දෙයාකාර බව
  - නිර්වාණාවබෝධය සඳහා ආර්ය අෂ්ටාංගික මාර්ගයේ ගමන් කිරීම දුක්ඛ නිරෝධ ගාමිණී ප්‍රතිපදාවෙන් පැහැදිලි කෙරෙන බව
  - චතුරාර්ය සත්‍ය ක්‍රමවේදය දෛනික ගැටලු විසඳා ගැනීමට භාවිත කරන බව

**ගුණාත්මක යෙදවුම්** : පොදු උපදෙස් අනුව ගුරු භවතාගේ අභිමතය පරිදි යොදා ගත හැකි ය.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්** :

මෙම නිපුණතා මට්ටමට අදාළ ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණයන් මැන බැලීමට සුදුසු ආකාරයේ නිර්ණායක සකස් කර ගැනීමට ගුරු භවතාට නිදහස ඇත.

**ගවේෂණ පත්‍රිකාව** :

කණ්ඩායම 1. චතුරාර්ය සත්‍යය "ඊ" සටහනකින් ඉදිරිපත් කරන්න.

කණ්ඩායම 2. දෛනික ගැටලු විසඳා ගැනීමට චතුරාර්ය සත්‍යය ක්‍රමවේදය යොදාගත හැකි ආකාරය පැහැදිලි කරන්න.

**ගෙදර පරිසරයෙන්** :

නිවසේ ගැටලු සහගත තත්ත්වයක් ඇති වූ අවස්ථාවක චතුරාර්ය සත්‍ය ක්‍රමවේදයට අනුව ඒවා විසඳා ගැනීමට දරුවාට උදව් සපයමින් ආදර්ශ සපයන්න.

**නිපුණතාව 07** : ජීවී, අජීවී පරිසරයට හිතකාමී ව හැසිරෙයි.

**නිපුණතා මට්ටම 10.7.1**: බුදුරජාණන් වහන්සේ ජීවී, අජීවී පරිසරය කෙරෙහි හිතකාමී ව ගත් කළ අයුරු දැන පරිසර සංවේදී ජීවිතයක් ගත කිරීමට ක්‍රියා කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02 යි.

**ඉගෙනුම් පල** :

- බුදු සිරිතේ ස්වාභාවික පරිසරය හා බැඳුණ අවස්ථා ගෙන හැර දක්වයි.
- ජීවී පැවැත්මට ස්වාභාවික පරිසරයෙන් ලැබෙන දායකත්වය අගය කරයි.
- ජීවී අජීවී පරිසරය හා බැඳුණු සිදුවීමක් ඇසුරින් නාට්‍ය පිටපතක් සකස් කර රඟ දක්වයි.
- තම පරිසරය ප්‍රසන්න ව පවත්වා ගනියි.
- පරිසර සංරක්ෂණයෙහි යෙදෙයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්** :

බුදු සිරිතේ ස්වාභාවික පරිසරය හා බැඳුණු අවස්ථා සාකච්ඡා කිරීම මෙම පාඩමේ දී අපේක්ෂිත ය.

**පියවර 1** :

- "දෙව්ලොව ද මව්බිමට දෙවෙනි කොට සිතන්නෙමු........." යනුවෙන් ඇරඹෙන පරිසර ගීතය දරුවන් සමග ගායනා කරන්න.
- පරිසර ගීතයේ ඇති වැදගත්කම විමසන්න.
- පහත සඳහන් කරුණු මතු කරමින් සාකච්ඡාවක් මෙහෙයවන්න.
    - ගීතයේ සරල අදහස, ගහ කොළ, ජලය, සතුන්, මනුෂ්‍ය ජීවිතය හා බැඳී පවතින බව
    - පරිසරයෙන් තොර ජීවිතයක් නොමැති බව
    - බුදු සිරිත පරිසරය හා බැඳී ඇති ආකාරය අධ්‍යයනය කළ යුතු බව

**පියවර 2** :

- සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් කොට ගවේෂණ පත්‍රිකා සිසුන් අතර බෙදා දී, අදාළ ක්‍රියාකාරකමෙහි සිසුන් නිරත කරවන්න.

**පියවර 3** :

- කණ්ඩායම් අනාවරණ පන්තියට ඉදිරිපත් කරන්නට හා, ඌනපූරණ හෝ සංවර්ධනාත්මක යෝජනා සඳහා සිසුන්ට අවස්ථාව ලබා දෙමින්, පහත සඳහන් කරුණු ද මතු කරමින් සමාලෝචනයක යෙදෙන්න.
    - බුද්ධ චරිතයේ සියලු වැදගත් සිදුවීම් ස්වභාව සෞන්දර්යය හා බැඳී පැවතුණු බව (උපත, බුද්ධත්වය, ප්‍රථම ධර්ම දේශනය, පිරිනිවන් පෑම)
    - බුදුරජාණන් වහන්සේ විනය නීති පැනවීමේ දී ස්වභාව සෞන්දර්යය ආරක්ෂා කිරීමට වැඩි අවධානයක් යොමු කළ බව
    - බෞද්ධ ඉගැන්වීම් ස්වාභාවික පරිසරය හා බැඳී පවතින බව

- මිනිසාගේ පැවැත්ම උදෙසා පරිසරය ආරක්ෂා කිරීම වැදගත් වන බව
- ජීව අජීව පරිසරයෙන් ලැබෙන රැකවරණයට පෙරළා කළගුණ සැලකීම වැදගත් බව
- ජීව අජීව පරිසරය විනාශ වීම වළකාලීමට ක්‍රියා කළ යුතු බව

**ගුණාත්මක යෙදවුම්** : පොදු උපදෙස් අනුව ගුරු භවතාගේ අභිමතය පරිදි යොදා ගත හැකි ය.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

මෙම නිපුණතා මට්ටමට අදාළ ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණයන් මැන බැලීමට සුදුසු ආකාරයේ නිර්ණායක සකස් කර ගැනීමට ගුරු භවතාට නිදහස ඇත.

**ගවේෂණ පත්‍රිකාව** :

කණ්ඩායම 1. බුදු සිරිතේ ප්‍රධාන සිද්ධි හතර හා බැඳුණ ස්වාභාවික පරිසර අවස්ථා පිළිබඳ පැහැදිලි කිරීමට අවශ්‍ය කරුණු ගොනු කරන්න.

කණ්ඩායම 2. බුදු දහමේ ස්වාභාවික පරිසරය අගය කළ අවස්ථා දක්වන්න.

කණ්ඩායම 3. ස්වාභාවික පරිසරය හා මිනිස් ජීවිත අතර සබැඳියාව විදහා දැක්වෙන නාට්‍යයක පිටපතක් සකස් කරන්න.

කණ්ඩායම 4. ජීව අජීව පරිසරය විනාශ වන ආකාරය දක්වා එම හානි වළක්වාලීමට ගත හැකි ක්‍රියාමාර්ග ලැයිස්තු ගත කරන්න.

**ගෙදර පරිසරයෙන්** :

නිවසේ පරිසරය පිරිසිදු ව පවත්වා ගැනීමට අවශ්‍ය කරුණු දරුවා සමග සාකච්ඡා කර ඒ අනුව කටයුතු සම්පාදනය කරන්න.

**නිපුණතාව 07** : ජීවි අජීවී පරිසරයට හිතකාමී ව හැසිරෙයි.

**නිපුණතා මට්ටම 10.7.2**: නීරෝගතාවට අදාළ බෞද්ධ ඉගැන්වීම් හැදින සෞඛ්‍ය සම්පන්න ජීවිතයක් ගත කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02 යි

**ඉගෙනුම් පල** :

- නීරෝගීතාවට අදාළ බෞද්ධ ඉගැන්වීම් ඉදිරිපත් කරයි.
- සෞඛ්‍ය සම්පන්න ජීවිතයක් ගත කිරීමේ වැදගත්කම පෙන්වා දෙයි.
- සෞඛ්‍ය සම්පන්න ජීවිතයක් ගත කිරීමට යෝග්‍ය උපදෙස් පත්‍රිකාවක් සකස් කරයි.
- තම කායික මානසික සෞඛ්‍ය පිළිබඳ සැලකිලිමත් වෙයි.
- සෞඛ්‍ය සම්පන්න දිවි පැවැත්මක් ගොඩනඟා ගනියි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්** :

සෞඛ්‍ය සම්පන්න ජීවිතයක් සඳහා විනය පිටකයේ අදාළ ඉගැන්වීම් භාවිතයට ගැනීම පිළිබඳ අධ්‍යයනය මෙම පාඩමෙන් අපේක්ෂිත ය.

**පියවර 1** :

- "ආරෝග්‍ය පරමා ලාභා" යනුවෙන් ඇරඹෙන ධම්මපද ගාථාව සිසුන් සමග තාලයට සජ්ඣායනා කරන්න.
- පහත සඳහන් කරුණු මතු කරමින් සාකච්ඡාවක් මෙහෙයවන්න.
  - ඉදිරිපත් කරන ලද ගාථාව ධම්මපදය සුඛ වග්ගයට අයත් බව
  - "ආරෝග්‍ය පරමා ලාභා" යන පාඨයේ මූලික අදහස ලෙස දක්වන පරම ලාභය, නීරෝගීකම බව
  - බෞද්ධ ඉගැන්වීම් මගින් නීරෝගීකම පිළිබඳ කරුණු පැහැදිලි කරන බව

**පියවර 2** :

- සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් කොට ගවේෂණ පත්‍රිකා සිසුන් අතර බෙදා දී, අදාළ ක්‍රියාකාරකමෙහි සිසුන් නිරත කරවන්න.

**පියවර 3** :

- කණ්ඩායම් අනාවරණ පන්තියට ඉදිරිපත් කරන්නට හා, ඌනපූරණ හෝ සංවර්ධනාත්මක යෝජනා සඳහා සිසුන්ට අවස්ථාව ලබා දෙමින්, පහත සඳහන් කරුණු ද මතු කරමින් සමාලෝචනයක යෙදෙන්න.
  - නීරෝගීතාව කායික මානසික වශයෙන් දෙවැදෑරුම් බව
  - බුදුදහම මානසික මෙන්ම කායික නීරෝගීතාව ද ඉතා වැදගත් කොට සැලකූ බව
  - ගිරිමානන්ද සූත්‍රයේ දැක්වෙන පරිදි, තුන් දොස් කිපීම, පාරිසරික සාධක මෙන් ම විසම චර්යාව ද රෝගිත්වයට බලපාන බව

- රෝගීන්ට උවටැන් කිරීම තමාට කරන උපස්ථානයක් ලෙස සලකා බුදුරජාණන් වහන්සේ අගය කළ බව
- සිගාලෝවාද සූත්‍රයට අනුව කායික රෝග වැළඳීමට මත්වතුර, මත්ද්‍රව්‍ය භාවිතය හේතු වන බව
- ආහාර ගැනීම හා සම්බන්ධයෙන් සේඛියා ධර්මවලින් සෞඛ්‍ය සම්පන්න ජීවිතයකට උපදෙස් ලබා දෙන බව
- කායික ව හා මානසික ව සුඛිත මුදිත වීමට අනුගමනය කළ හැකි ක්‍රියා මාර්ග ඇති බව

**ගුණාත්මක යෙදවුම්** : පොදු උපදෙස් අනුව ගුරු භවතාගේ අභිමතය පරිදි යොදා ගත හැකි ය.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්** :

මෙම නිපුණතා මට්ටමට අදාළ ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණයන් මැන බැලීමට සුදුසු ආකාරයේ නිර්ණායක සකස් කර ගැනීමට ගුරු භවතාට නිදහස ඇත.

**ගවේෂණ පත්‍රිකාව** :

කණ්ඩායම 1. නීරෝගී පැවැත්මට අදාළ බෞද්ධ ඉගැන්වීම් ඉදිරිපත් කරන්න.

කණ්ඩායම 2. සෞඛ්‍ය සම්පන්න ජීවිතයක් ගත කිරීමට උපදෙස් මාතෘකාව යටතේ අත් පත්‍රිකාවක් සකස් කරන්න.

කණ්ඩායම 3. සෞඛ්‍ය සම්පන්න ජීවිතයක් ගත කිරීම සඳහා ඔබට අනුගමනය කළ හැකි ක්‍රියාමාර්ග පන්තියට ඉදිරිපත් කරන්න.

**ගෙදර පරිසරයෙන්** :

පවුලේ සියලු දෙනාට කායික/මානසික සුවතාව සඳහා දෛනික ව යොදා ගත හැකි ක්‍රියාකාරකම් සටහනක් සකස් කර ඒ අනුව කටයුතු කරන්න.

**නිපුණතාව 07 :** ජීවී අජීවී පරිසරයට හිතකාමී ව හැසිරෙයි.

**නිපුණතා මට්ටම 10.7.3:** ආහාර පරිභෝජනයේ දී බුදු සිරිත ඇසුරින් ආදර්ශ ගෙන කටයුතු කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව :** 02 යි

**ඉගෙනුම් පල :**

- යෝග්‍ය ආහාර පිළිබඳ උපදෙස් පත්‍රිකාවක් සකස් කරයි.
- ආහාර පරිභෝජනය නිවැරදි ව සිදු කළ යුත්තක් බව පෙන්වා දෙයි.
- ආහාර පරිභෝජනයේ දී සැලකිලිමත් විය යුතු බෞද්ධ ඉගැන්වීම් ඉදිරිපත් කරයි.
- ආහාර තෝරා ගැනීමේ දී හිතකර අහිතකර බව පිළිබඳ සැලකිලිමත් වෙයි.
- සැහැල්ලු සහ නීරෝගී දිවි පැවැත්මක් ගොඩනගා ගනියි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස් :**

වර්තමාන අහිතකර ආහාර රටා, නිවැරදි ආහාර රටාවක් තෝරා ගැනීම පිළිබඳ බුදුසිරිතේ නිදසුන් මේ පාඩමේ දී සාකච්ඡා කෙරේ.

**පියවර 1 :**

- අධික ව ආහාර ගෙන අපහසුතාවට පත් ව සිටි කොසොල් රජු අරභයා බුදුරජාණන් වහන්සේ දේශනා කළ උපදේශාත්මක කථා පුවත පන්තියට ඉදිරිපත් කරන්න.
- පහත සඳහන් කරුණු මතු කරමින් සාකච්ඡාවක් මෙහෙය වන්න.
  - පමණ දැන ආහාර අනුභවය බුදුදහමින් අගය කෙරෙන බව
  - බුදුරජාණන් වහන්සේ දානය වැළඳීමේ දී අනුගමනය කළ ප්‍රතිපත්ති මගින් ආදර්ශ ලැබිය හැකි බව

**පියවර 2 :**

- සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් කොට ගවේෂණ පත්‍රිකා සිසුන් අතර බෙදා දී, අදාළ ක්‍රියාකාරකමෙහි සිසුන් නිරත කරවන්න.

**පියවර 3 :**

- කණ්ඩායම් අනාවරණ පන්තියට ඉදිරිපත් කරන්නට හා, ඌනපූරණ හෝ සංවර්ධනාත්මක යෝජනා සඳහා සිසුන්ට අවස්ථාව ලබා දෙමින්, පහත සඳහන් කරුණු ද මතු කරමින් සමාලෝචනයක යෙදෙන්න.
  - බුදු දහමට අනුව නිවැරදි ආහාර පරිභෝජනය නිරෝගීතාව සඳහා වැදගත් වන බව
  - ධම්මපද දේශනාවල ආහාර පරිභෝජනය පිළිබඳව කරුණු දක්වා ඇති බව
  - නූතන අහිතකර පරිභෝජන රටාව රෝගාබාධ රැසකට හේතු වන බව

- පමණ නොදැන ආහාර අනුභව කරන්නන් පස් දෙනකු ගැන බුදු සමයෙහි දැක්වෙන බව (ආහාර හත්ථක, අලංසාටක, තත්‍රවට්ටක, කාකමාසක, භුත්තවම්තක)
- සේඛියා ධර්මවලින් ආහාර පරිභෝජනය කළ යුතු අන්දම පැහැදිලි කරන බව
- හිතකර ආහාර රටාව නිසා සෞඛ්‍ය සම්පන්න ජීවිතයක් ගත කළ හැකි බව

**ගුණාත්මක යෙදවුම් :** පොදු උපදෙස් අනුව ගුරු භවතාගේ අභිමතය පරිදි යොදා ගත හැකි ය.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

මෙම නිපුණතා මට්ටමට අදාළ ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණයන් මැන බැලීමට සුදුසු ආකාරයේ නිර්ණායක සකස් කර ගැනීමට ගුරු භවතාට නිදහස ඇත.

**ගවේෂණ පත්‍රිකාව :**

කණ්ඩායම 1. ආහාර පරිභෝජනයෙහි නිවැරදි රටාවක් ගොඩනගා ගන්නා ආකාරය පෙන්වා දෙන්න.

කණ්ඩායම 2. " ආහාර පරිභෝජනයට නිවැරදි පුරුදු අනුගමනය කරමු." යන ශීර්ෂය යටතේ උපදෙස් පත්‍රිකාවක් සකස් කරන්න.

කණ්ඩායම 3. අහිතකර ආහාර පරිභෝජන රටාවෙන් සිදු වන හානි පෙන්වා දෙන්න

කණ්ඩායම 4. හිතකර ආහාර රටාවකට හුරු වීමෙන් ලැබෙන ප්‍රයෝජන ඉදිරිපත් කරන්න.

**ගෙදර පරිසරයෙන් :**

යෝග්‍ය ආහාර සඳහා, ගෙවතු වගාවට දරුවන් සමග යොමුවන්න.

**නිපුණතාව 08** : ශාසන ඉතිහාසය හා ශ්‍රී ලාංකික බෞද්ධ උරුමය හැඳින එම උරුමය රැක ගැනීමට ක්‍රියා කරයි.

**නිපුණතා මට්ටම 10.8.1** : ශාසන පැවැත්ම උදෙසා ධර්ම සංගායනාවලින් වූ සේවය හැඳින ශාසන සුරක්ෂිතතාව ට දායක වෙයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02 යි.

**ඉගෙනුම් පල** :

- අලුවිහාර ධර්ම සංගායනාවේ හා කණිෂ්ක ධර්ම සංගායනාවේ වැදගත්කම විස්තර කරයි.
- සංගායනා ශාසන චිරස්ථිතියට හේතු වූ බව පිළිගනියි.
- සංගායනා දෙක සංසන්දනය කරමින් ප්‍රතිඵල ලැයිස්තු ගත කරයි.
- නිසි අවස්ථාවේ දී ම සුරක්ෂිත කළ යුතු දෑ සුරක්ෂිත කිරීමට කැපවෙයි.
- සාකච්ඡා මාර්ගයෙන් විසඳුම් සොයයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්** :

ථෙරවාද සංගායනා පිළිවෙළෙහි සතර වැන්න - මාතලේ අලුවිහාර සංගායනාව, ඉන්දීය ඉතිහාසයේ ධර්ම සංගායනා පිළිවෙළෙහි සතර වැන්න - කණිෂ්ක සංගායනාව පිළිබඳ අධ්‍යයනය මෙම පාඩමෙන් අපේක්ෂිත ය.

**පියවර 1** :

- ධර්ම සංගායනා පිළිබඳ පෙර දැනුම විමසන්න.
- පහත සඳහන් කරුණු මතු කරමින් සාකච්ඡාවක් මෙහෙයවන්න.
  - යම් ගැටලුවක් ඇති වූ විට සාකච්ඡා මාර්ගයෙන් විසදා ගැනීමේ ක්‍රමයක් අතීතයේ සිට ම පැවති බව
  - බුදුරජාණන් වහන්සේ ජීවමාන කාලයේ දී ද සාමූහික ව තීරණ ගැනීමේ වැදගත්කම පෙන්වා දී ඇති බව
  - පැවැත්වූ ධර්ම සංගායනාවලින් ශාසන චිරස්ථිතිය සිදු වූ බව

**පියවර 2** :

- සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් කොට ගවේෂණ පත්‍රිකා සිසුන් අතර බෙදා දී, අදාළ ක්‍රියාකාරකමෙහි සිසුන් නිරත කරවන්න.

**පියවර 3** :

- කණ්ඩායම් අනාවරණ පන්තියට ඉදිරිපත් කරන්නට හා, ඌනපූරණ හෝ සංවර්ධනාත්මක යෝජනා සඳහා සිසුන්ට අවස්ථාව ලබා දෙමින්, පහත සඳහන් කරුණු ද මතු කරමින් සමාලෝචනයක යෙදෙන්න.
  - ප්‍රථම, දෙවන හා තෙවන සංගායනා ශාසන ඉතිහාසයේ වැදගත් තැනක් ගන්නා බව

- මාතලේ අලුවිහාර ධර්ම සංගායනාව පැවැත්වීම සඳහා කරුණු රැසක් පදනම් වූ බව (බැමිණිතියා සාගතය, ධර්මය වණපොත් කළ භික්ෂූන් වහන්සේලා අපවත්වීම, වරින්වර ඇති වූ පරසතුරු ආක්‍රමණ)
- අලුවිහාර ධර්ම සංගායනාව පැවැත්වීම හා එහි සුවිශේෂ ප්‍රතිඵලය වූ ධර්මය ග්‍රන්ථාරූඪ කිරීමේ සිට වත්මන් භාවිතයේ පවතින පොත්පත් දක්වා ධර්ම සංග්‍රහ වැඩ පිළිවෙළ විකාශය වූ බව
- සසුනෙහි පැවැත්ම උදෙසා ධර්මය ලේඛන ගත කොට තිබීම වැදගත් වූ බව
- ඉන්දීය ඉතිහාසයේ කණිෂ්ක ධර්ම සංගායනාව ට පසුබිම් කාරක කරුණු රැසක් වූ බව (ධර්මධර භික්ෂූන් විවිධ මත දැරීම)
- ගැටලු නිරාකරණය කිරීමේ දී සාමූහික ව කටයුතු කිරීම වැදගත් බව

**ගුණාත්මක යෙදවුම් :** පොදු උපදෙස් අනුව ගුරු භවතාගේ අභිමතය පරිදි යොදා ගත හැකි ය.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

මෙම නිපුණතා මට්ටමට අදාළ ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණයන් මැන බැලීමට සුදුසු ආකාරයේ නිර්ණායක සකස් කර ගැනීමට ගුරු භවතාට නිදහස ඇත.

**ගවේෂණ පත්‍රිකාව :**

කණ්ඩායම 1. මාතලේ අලුවිහාර සංගායනාව

කණ්ඩායම 2. කණිෂ්ක ධර්ම සංගායනාව

කණ්ඩායම 3. ගැටලු නිරාකරණයේ දී සාමූහික ව කටයුතු කිරීමේ වැදගත්කම අදාළ ධර්ම සංගායනා ඇසුරෙන් පෙන්වා දෙන්න.

**ගෙදර පරිසරයෙන් :**

නිවසේ රැක ගත යුතු පූජනීය වස්තු හා වටිනා පෞරාණික උපකරණ සුරක්ෂිත කර ගැනීම සඳහා දරුවා ද සමග කටයුතු කරන්න.

**නිපුණතාව 08** : ශාසන ඉතිහාසය හා ශ්‍රී ලාංකික බෞද්ධ උරුමය හැඳින එම උරුමය රැක ගැනීමට ක්‍රියා කරයි.

**නිපුණතා මට්ටම 10.8.2**: ශාසන ඉතිහාසයෙන් උරුම වූ ගෘහ නිර්මාණ ශිල්ප, චිත්‍ර හා කැටයම් අගයමින් ඒවා සංරක්ෂණය කිරීමට දායක වෙයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02 යි.

**ඉගෙනුම් පල** :

- ශාසන ඉතිහාසයෙන් අපට උරුම වූ කලා නිර්මාණ මොනවාදැයි පැහැදිලි කරයි.
- කලා ශිල්ප සංරක්ෂණය කළ යුතු බව පෙන්වා දෙයි.
- ගෘහ නිර්මාණ, චිත්‍ර, කැටයම්වලට අදාළ නිර්මාණ වෙන් වෙන් ව ලැයිස්තු ගත කරයි.
- අතීත උරුමයන් අගයමින් ආරක්ෂා කරයි.
- පෞරාණික ස්ථාන නැරඹීමේ දී ඒවායේ පෞරාණිකත්වයට හානි නොවන සේ කටයුතු කරයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්** :

ස්තූපය, ස්තූප වර්ග, ස්තූපයක කොටස්, චෛතියඝර, වාහල්කඩ, පියගැට පෙළ, මුරගල, කොරවක්ගල, සඳකඩපහණ, බෝධිඝර, සහ අනුරාධපුර පොළොන්නරු චිත්‍ර පිළිබඳ අධ්‍යයනය මෙම පාඩමෙන් අපේක්ෂිත ය.

**පියවර 1** :

- අනුරාධපුර යුගයේ කලා කෘතියක සිතුවමක් හෝ අනුරුවක් සිසුන් ඉදිරියේ ප්‍රදර්ශනය කරන්න.
- පහත සඳහන් කරුණු මතු කරමින් සාකච්ඡාවක් මෙහෙය වන්න.
  - මෙම කලා නිර්මාණය අනුරාධපුර යුගයට අයත් වන බව
  - පැරණි කලාකරුවා සතුව තිබූ විස්මිත කලා හැකියාව මෙමගින් මූර්තිමත් වන බව
  - මෙවැනි කලා නිර්මාණ රාශියක් අනුරාධපුර හා පොලොන්නරු යුගවල දකින්නට ලැබෙන බව
  - කලා නිර්මාණ සුරක්ෂිත කළ යුතු බව

**පියවර 2** :

- සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් කොට ගවේෂණ පත්‍රිකා සිසුන් අතර බෙදා දී, අදාළ ක්‍රියාකාරකමෙහි සිසුන් නිරත කරවන්න.

**පියවර 3** :

- කණ්ඩායම් අනාවරණ පන්තියට ඉදිරිපත් කරන්නට හා, ඌනපූරණ හෝ සංවර්ධනාත්මක යෝජනා සඳහා සිසුන්ට අවස්ථාව ලබා දෙමින්, පහත සඳහන් කරුණු ද මතු කරමින් සමාලෝචනයක යෙදෙන්න.
  - පැරණි කලා නිර්මාණ අපට අතිශයින් වැදගත් බව
  - බුබ්බුලාකාර, ධාන්‍යාකාර, ඝණ්ඨාකාර, ඝඨාකාර, පද්මාකාර, ආමලකාකාර වශයෙන් ස්තූප ආකාර හයක් ඇති බව
  - පාදම, පේසා වළලු, ගර්භය, දේවතා කොටුව, හතරැස් කොටුව, කොත් කැරැල්ල, කොත වශයෙන් ස්තූපයක කොටස් වෙන් වෙන් ව හඳුනා ගත යුතු බව
  - චෛත්‍යයක ආරක්ෂාව සඳහා ඉදිකරන ලද ගෙය චේතියඝර ලෙස හඳුන් වන බව
  - වාහල්කඩ, පියගැට පෙළ, මුරගල, කොරවක්ගල, සඳකඩපහණ ආගමික ආභාසය ලත් කලා නිර්මාණ බව
  - බෝධියේ ආරක්ෂාව සඳහා නිර්මාණය කළ ගෘහය බෝධිඝර ලෙස හඳුන්වන බව
  - අනුරාධපුර රුවන් වැලි සෑය, පොළොන්නරු තිවංක පිළිමගේ ඇති චිත්‍ර වටිනා කලා කෘති බව
  - පැරැන්නන් මේවා ආරක්ෂා කළ නිසා අද දක්වා ම නොනැසී පවත්වා ගත හැකිවීම ජාතියේ භාග්‍යයක් බව
  - මෙම නිර්මාණ නැරඹීමෙන් අභිමානයක් ඇති වන බව
  - කලා නිර්මාණ අනාගත පරපුර වෙනුවෙන් සංරක්ෂණය කිරීම සියලු දෙනාගේ වගකීමක් බව

**ගුණාත්මක යෙදවුම් :** පොදු උපදෙස් අනුව ගුරු භවතාගේ අභිමතය පරිදි යොදා ගත හැකි ය.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

මෙම නිපුණතා මට්ටමට අදාළ ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණයන් මැන බැලීමට සුදුසු ආකාරයේ නිර්ණායක සකස් කර ගැනීමට ගුරු භවතාට නිදහස ඇත.

**ගවේෂණ පත්‍රිකාව** :

කණ්ඩායම 1. ස්තූපය, ස්තූප වර්ග, ස්තූපයක කොටස්, චේතියඝර

කණ්ඩායම 2. වාහල්කඩ, පියගැට පෙළ, මුරගල, කොරවක් ගල, සඳකඩපහණ, බෝධිඝර, අනුරපුර හා පොළොන්නරු චිත්‍ර

කණ්ඩායම 3. ශාසන ඉතිහාසයෙන් අපට උරුම වූ ගෘහ නිර්මාණ ශිල්පයේ, චිත්‍ර හා කැටයම් කලාවේත් වැදගත්කම සඳහන් කොට ඒවායේ සංරක්ෂණය සඳහා ගත හැකි ක්‍රියාමාර්ග ඉදිරිපත් කරන්න.

**ගෙදර පරිසරයෙන්** :

නිවසේ සියලු දෙනා සමග අනුරපුර - පොලොන්නරු චාරිකාවක යෙදී පැරණි කලා නිර්මාණ පිළිබඳ රැස් කරන ලද තොරතුරු ඇතුළත් පොතක් සකස් කරන්න.

**නිපුණතාව 08** : ශාසන ඉතිහාසය හා ශ්‍රී ලාංකික බෞද්ධ උරුමය හැඳින එම උරුමය රැක ගැනීමට ක්‍රියා කරයි.

**නිපුණතා මට්ටම 10.8.3**: බුදු දහම ඇසුරින් පෝෂණය වූ සිංහල සාහිත්‍යය රසාස්වාදය කරමින් ඒවා සංරක්ෂණයට දායක වෙයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02 යි.

**ඉගෙනුම් පල** :

- අනුරාධපුර, පොලොන්නරු හා දඹදෙණි යුගයන්හි බෞද්ධ සාහිත්‍යය කෘති නම් කරයි.
- බෞද්ධ සාහිත්‍යය ග්‍රන්ථ පරිශීලනයෙන් රසාස්වාදයක් ලැබිය හැකි බව පිළිගනියි.
- ඉහත යුගයන්හි ගද්‍ය පද්‍ය සාහිත්‍යය කෘති අනුපිළිවෙළට ලැයිස්තු ගත කරයි.
- සාහිත්‍යය කෘතිවල අන්තර්ගතය සොයා බලමින් පරිහරණය කරයි.
- පැරණි සාහිත්‍යය කෘති සංරක්ෂණයට දායක වෙයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්** :

අනුරාධපුර, පොළොන්නරු, දඹදෙණි යුගයන්හි ගද්‍ය. පද්‍ය සාහිත්‍යය පිළිබඳ අධ්‍යයනය මෙම පාඩමෙන් අපේක්ෂිත ය.

**පියවර 1** :

- "ඈත ධූලීන් වැසී ගිය ඇත් රජ ය. මෑත සවණක් ගණ රැසින් සැදී ගිය බුදුරජාණෝ ය. ඈත රත් වූ යවට වැනි ඇස් ඇති ඇත් රජ ය. මෑත නිල් මහනෙල් පෙති පරයන ඇස් ඇති බුදුරජාණෝ ය." යන බුත්සරණ පාඨය සිසුන්ට ඉදිරිපත් කරන්න.
- පහත සඳහන් කරුණු මතු කරමින් සාකච්ඡාවක් මෙහෙයවන්න.
  - ඉහත පාඨය දඹදෙණි යුගයේ විද්‍යාචක්‍රවර්තීන් විසින් රචිත බුත්සරණ කෘතියේ ඇතුළත් බව
  - මෙමගින් නාලාගිරි දමනයේ විචිත්‍රත්වය විස්තර වන බව
  - මෙවැනි සාහිත්‍ය කෘති රාශියක් අනුරාධපුර, පොලොන්නරු හා දඹදෙණි යුගයන්හි රචනා වී ඇති බව

**පියවර 2** :

- සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් කොට ගවේෂණ පත්‍රිකා සිසුන් අතර බෙදා දෙන්න.
- අදාළ ක්‍රියාකාරකමෙහි සිසුන් නිරත කරවන්න.

**පියවර 3** :

- කණ්ඩායම් අනාවරණ පන්තියට ඉදිරිපත් කරන්න.
- ඌනපූරණ හෝ සංවර්ධනාත්මක යෝජනා සඳහා සිසුන්ට අවස්ථාව ලබා දෙමින් පහත සඳහන් කරුණු ද මතු කරමින් සමාලෝචනයක යෙදෙන්න.

- බුදු දහමේ ආභාසය ලබා ගද්‍ය පද්‍ය ග්‍රන්ථයන්හි වස්තු බීජයන් සැකසී ඇති බව
- අනුරාධපුර, පොළොන්නරු, දඹදෙණි යුගයන්හි රචිත ගද්‍ය පද්‍ය කෘති මගින් එම යුගවල පැවැති ජනසමාජය පිළිබඳ තොරතුරු රැසක් හෙළි වන බව
- ගත් කතුවරුන් තුළ පැවැති ආගමික ශ්‍රද්ධාව මෙම සාහිත්‍ය ග්‍රන්ථ පරිශීලනයෙන් හෙළි වන බව
- ධාර්මික රසාස්වාදය සඳහා මෙන් ම ධාර්මික ප්‍රීති සුඛය සඳහා ද මෙවැනි කෘති ඉවහල් කර ගත හැකි බව
- මෙම කෘති ඇසුරෙන් භාෂාවේ නව ප්‍රවණතා හා භාෂාවේ විකාශය සිදු වූ බව
- දේශීය අනන්‍යතාවෙන් යුතු සාහිත්‍යයක් ගොඩනැංවීමට මෙම කෘති ඉවහල් වූ බව
- පැරණි කෘති සංරක්ෂණයෙන් අනාගත පරපුරට ද ඒවා දායාද කිරීමට හැකියාව ලැබෙන බව

**ගුණාත්මක යෙදවුම්** : පොදු උපදෙස් අනුව ගුරු භවතාගේ අභිමතය පරිදි යොදා ගත හැකි ය.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

මෙම නිපුණතා මට්ටමට අදාළ ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණයන් මැන බැලීමට සුදුසු ආකාරයේ නිර්ණායක සකස් කර ගැනීමට ගුරු භවතාට නිදහස ඇත.

**ගවේෂණ පත්‍රිකාව** :

අනුරාධපුර, පොලොන්නරු, දඹදෙණි යුගයන්හි සාහිත්‍ය කෘති පළමු කණ්ඩායම ගද්‍ය වශයෙන් ද, දෙවන කණ්ඩායම පද්‍ය වශයෙන් ද වගු ගත කරන්න.

| යුගය | කෘතිය | කතුවරයා | අන්තර්ගතය |
|---|---|---|---|
| | | | |

කණ්ඩායම 3. ඉහත යුගයන්හි ගද්‍ය පද්‍ය සාහිත්‍ය කෘති සංරක්ෂණය කිරීමේ අවශ්‍යතාව පැහැදිලි කරන්න.

**ගෙදර පරිසරයෙන්** :

පැරණි සාහිත්‍ය කෘති කියවීම සඳහා දරුවා පොලඹවා, ඒ සඳහා පහසුකම් ලබා දෙන්න.

**නිපුණතාව 09** : බෞද්ධ ආර්ථික හා රාජ්‍ය පාලන චින්තනය හැඳින ගෙන ඒ අනුව ක්‍රියා කරයි.

**නිපුණතා මට්ටම 10.9.1**: බෞද්ධ රාජ්‍ය පාලන ප්‍රතිපත්ති හදාරා තම ජීවිතයේ නායකත්ව අවස්ථාවන්ට සාර්ථක ව මුහුණ දෙයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02 යි.

**ඉගෙනුම් පල** :

- රාජ්‍ය පාලනයට උපයෝගී කර ගත හැකි බෞද්ධ ප්‍රතිපත්ති විස්තර කරයි.
- ධාර්මිකත්වය පදනම් කොට බෞද්ධ රාජ්‍ය පාලන ප්‍රතිපත්ති සකස් වී ඇති බව පිළිගනියි.
- බෞද්ධ රාජ්‍ය පාලන ප්‍රතිපත්ති සංකල්ප සිතියමක් මගින් ඉදිරිපත් කරයි.
- වගකීමෙන් හා වගවීමෙන් යුතු ව කටයුතු කරයි.
- නීති ගරුක ව ජීවත් වේ.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්** :

දස සක්විති වත්, සප්ත අපරිහානිය ධර්ම, සතර සංග්‍රහ වස්තු, සතර අගති විරතිය ප්‍රායෝගික ජීවිතයට සම්බන්ධ කර ගැනීම මෙම පාඩමෙන් අපේක්ෂිත ය.

**පියවර 1** :

- "දළ්හනේමි ජාතකය" කථා පුවත සිසුන්ට සිහිපත් කරන්න.
- පහත සඳහන් කරුණු මතු කරමින් සාකච්ඡාවක් මෙහෙයවන්න.
  - දළ්හනේමි රජු සක්විති රාජ්‍ය ප්‍රතිපත්ති අනුගමනය කළ අයෙකු බව
  - බුදුරජාණන් වහන්සේ රාජ්‍ය පාලනය සඳහා සුදුසු රාජ්‍ය ප්‍රතිපත්ති සමූහයක් අනුමත කර ඇති බව
  - මෙම රාජ්‍ය ප්‍රතිපත්ති විස්තරාත්මක ව හැදෑරීමෙන් නායකත්ව කුසලතා වර්ධනය කර ගත හැකි බව

**පියවර 2** :

- සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් කොට ගවේෂණ පත්‍රිකා සිසුන් අතර බෙදා දී, අදාළ ක්‍රියාකාරකමෙහි සිසුන් නිරත කරවන්න.

**පියවර 3** :

- කණ්ඩායම් අනාවරණ පන්තියට ඉදිරිපත් කරන්නට හා ඌනපූරණ හෝ සංවර්ධනාත්මක යෝජනා සඳහා සිසුන්ට අවස්ථාව ලබා දෙමින්, පහත සඳහන් කරුණු ද මතු කරමින් සමාලෝචනයක යෙදෙන්න.
  - ධාර්මික රාජ්‍ය පාලනයට බුදු දහමින් උපදෙස් ලබා දී ඇති බව
  - එම උපදෙස් දස සක්විතිවත්, සප්ත අපරිහානීය ධර්ම, සතර සංග්‍රහ වස්තු, සතර අගති විරතිය යන කරුණුවලින් ද පැහැදිලි වන බව

- බුද්ධ කාලීන රජවරුන් (ලිච්ඡවීන්, මල්ලවයන්, බිම්බිසාර ආදීන්) මෙම ප්‍රතිපත්තිවලට අනුගත වෙමින් පාලන කටයුතු පවත්වා ගෙන ගිය බව
- වර්තමාන රාජ්‍ය පාලනයේ දී ද මෙම ක්‍රම අනුගමනය කළ හැකි බව
- සමාජ ජීවිතයේ දී පැවරෙන කාර්යයන් වගකීමෙන් හා වගවීමෙන් ඉටු කරන්නට බැඳී සිටිය යුතු බව

**ගුණාත්මක යෙදවුම්** : පොදු උපදෙස් අනුව ගුරු භවතාගේ අභිමතය පරිදි යොදා ගත හැකි ය.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

මෙම නිපුණතා මට්ටමට අදාළ ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණයන් මැන බැලීමට සුදුසු ආකාරයේ නිර්ණායක සකස් කර ගැනීමට ගුරු භවතාට නිදහස ඇත.

**ගවේෂණ පත්‍රිකාව** :

කණ්ඩායම 1. දස සක්විති වත්, සතර සංග්‍රහ වස්තු ධාර්මික රාජ්‍ය පාලනයට යොදා ගත හැකි ආකාරය පැහැදිලි කරන්න.

කණ්ඩායම 2. සප්ත අපරිහානීය ධර්ම, සතර අගති විරතිය ධාර්මික රාජ්‍ය පාලනයට යොදා ගත හැකි ආකාරය පැහැදිලි කරන්න.

කණ්ඩායම 3. ඔබට පැවරෙන යහපත් කාර්යයන්හි දී වගකීමෙන් හා වගවීමෙන් කටයුතු කරන ආකාරය පැහැදිලි කරන්න.

**ගෙදර පරිසරයෙන්** :

නිවසේ කටයුතු දරුවන් හා සහයෝගයෙන් යුතු ව සංවිධානය කරන්න.

**නිපුණතාව 10** : නිර්වාණය අරමුණු කොට ගෙන ආර්ය මාර්ගයේ ගමන් කරයි.

**නිපුණතා මට්ටම 10.10.1**: ශ්‍රද්ධාව පෙරටු කොට ආර්ය මාර්ගයේ ගමන් කිරීමට රාග, ද්වේශ, මෝහ පාලනය කළ යුතු බව පිළිගෙන ක්‍රියා කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02 යි.

**ඉගෙනුම් පල** :

- ආර්ය මාර්ගයේ ගමන් කිරීම සඳහා ශ්‍රද්ධාව මුල් වන ආකාරය පැහැදිලි කරයි.
- රාග, ද්වේශ, මෝහ පාලනය කිරීමෙන් සැනසිලිදායක ජීවිතයක් ගත කළ හැකි බව පිළිගනියි.
- ''අනිසි ලෙස පසිඳුරන් පිනවීමේ ආදීනව'' යන මැයෙන් කථාවක් පවත්වයි.
- ගැටුම් ඇති වීමට හේතු විග්‍රහ කරයි.
- සහනශීලී ජීවිතයක් ගත කරයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්** :

ශ්‍රද්ධාව, රාගක්ඛය, දෝසක්ඛය, මෝහක්ඛය ආර්ය මාර්ගයේ ගමන් කිරීමට උපයෝගි කර ගත හැකි ආකාරය පිළිබඳ අධ්‍යයන මෙම පාඩමෙන් අපේක්ෂිත ය.

**පියවර 1** :

- පුවත්පත් වාර්තාවක සඳහන්, පන්තියට යෝග්‍ය සිදු වීමක් ඉදිරිපත් කර සිසුන්ට ඒ ගැන කරුණු පහදන්න.
- පහත සඳහන් කරුණු මතු කරමින් සාකච්ඡාවක් මෙහෙයවන්න.
  - රාග, දෝස, මෝහ යන කෙලෙස් බුදු දහමේ අකුසල මූල ලෙස දැක්වෙන බව
  - ආර්ය මාර්ගයේ ගමන් කිරීමෙන් කෙලෙස් මූල නැති කළ හැකි බව

**පියවර 2** :

- සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් කොට ගවේෂණ පත්‍රිකා සිසුන් අතර බෙදා දී, අදාළ ක්‍රියාකාරකමෙහි සිසුන් නිරත කරවන්න.

**පියවර 3** :

- කණ්ඩායම් අනාවරණ පන්තියට ඉදිරිපත් කරන්නට හා ඌනපූරණ හෝ සංවර්ධනාත්මක යෝජනා සඳහා සිසුන්ට අවස්ථාව ලබා දෙමින්, පහත සඳහන් කරුණු ද මතු කරමින් සමාලෝචනයක යෙදෙන්න.
  - තුනුරුවනෙහි ගුණ පිළිබඳ පැහැදීම, අවබෝධය ශ්‍රද්ධාව බව
  - ශ්‍රද්ධාව මුල් කොට නිවන් මග ආරම්භ වන බව
  - රාග, දෝස, මෝහ ප්‍රහීණ කිරීමෙන් නිවන ලැබිය හැකි බව
  - පසිඳුරන්ට හමු වන අරමුණුවල ඇලීම රාගය බව
  - අකමැති අරමුණුවල ගැටීම හෙවත් ඒ අරමුණු නිසා සිතේ ඇති වන කිපීම ද්වේශය බව

- යථා තත්වය නිසිලෙස නොවැටහීම මුලාව හෙවත් මෝහය ලෙස හැඳින්වෙන බව
- සියලු ම ආකාරයේ වැරදිවලට මෙම කෙලෙස් තුන මුල් වන බව
- රාග, ද්වේශ, මෝහ පාලනයෙන් සහනදායී ජීවිතයක් පවත්වා ගත හැකි බව

**ගුණාත්මක යෙදවුම්** : පොදු උපදෙස් අනුව ගුරු භවතාගේ අභිමතය පරිදි යොදා ගත හැකි ය.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

මෙම නිපුණතා මට්ටමට අදාළ ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණයන් මැන බැලීමට සුදුසු ආකාරයේ නිර්ණායක සකස් කර ගැනීමට ගුරු භවතාට නිදහස ඇත.

**ගවේෂණ පත්‍රිකාව** :

කණ්ඩායම 1. රාග, ද්වේශ, මෝහ යන අකුසල මූල හඳුන්වා දෙන්න.

කණ්ඩායම 2. ආර්ය මාර්ගයේ ගමන් කිරීම ශ්‍රද්ධාවෙන් ආරම්භ වී නිවනෙන් අවසන් වන බව පැහැදිලි කරන්න.

කණ්ඩායම 3. කාලීන සමාජමය ගැටුමක් තෝරා ගෙන ඊට බලපෑ අකුසල මූල පැහැදිලි කරන්න.

**ගෙදර පරිසරයෙන්** :

1. නිවසේ සිදු කරනු ලබන ක්‍රියාවන්හි මානසික පසුබිම පිළිබඳ සමාලෝචනයක යෙදීමට පුහුණුවන්න.
2. තුනුරුවනෙහි ගුණ ප්‍රකට වන ඡායාරූප නිවසෙ හි ප්‍රදර්ශනය කර තබන්න.

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමෝපාය**

බුදුරජාණන් වහන්සේ ධරමාන සමයෙහි ම භාවිත කොට නිශ්චිත ප්‍රතිඵල විධිමත් ව ලබා ගත් ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමවේදයක් අප සතුව ඇත. බුද්ධ ධර්මය විෂය ඉගැන්වීමේ ක්‍රමවේදය තීරණය කිරීමේ දී සිසු නිපුණතා සංවර්ධනය වන පරිදි සැලසුම් සම්පාදනයට වැඩි අවධානයක් යොමු කර ඇති නිපුණතා පාදක අධ්‍යාපන ක්‍රමයේ දී ගුරු භූමිකාවේ සුවිශේෂ වෙනසක් මගින් ප්‍රබෝධාත්මක, සක්‍රීය ඉගෙනුම් ක්‍රියාවල යෙදෙන ඉගෙනුම්ලාභීන් ඔවුන්ට කේන්ද්‍ර ගත වූ ක්‍රියාවලියකට නිසැක වශයෙන් ම පත්වනු ඇත.

දැනට පන්ති කාමරයේ ක්‍රියාත්මක වන ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමවේදය සිසු - සිසු අන්තර් සම්බන්ධතා සංවර්ධනය වන අයුරු සකස් විය යුතු වේ. සරලත්වයෙන් සංකීර්ණත්වයට, සංයුත්ත දෙයින් වියුක්ත දෙයට සිසුන් යොමු කිරීම ගුරුවරයාගේ කාර්යය වේ. මෙහිදී ගුරු භවතා සම්පත්දායකයකුගේ තත්වයෙන් ක්‍රියා කිරීම අත්‍යවශ්‍යයි. ඉගෙනුම් පරිසරය සැලසුම් කිරීම, සිසුන්ගේ ඉගෙනුම් නිරීක්ෂණය, ශිෂ්‍ය දක්ෂතා හඳුනා ගැනීම, ඉදිරි පෝෂණ හා ප්‍රතිපෝෂණ ලබාදීම මෙන් ම පන්ති කාමරයෙන් බැහැරට ඉගෙනුම ව්‍යාප්ත වන අයුරු කටයුතු සංවිධානය ගුරුභවතාගෙන් ඉටුවිය යුතු මූලික කාර්යයන් වේ.

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ දී පරිණාමන ගුරු භූමිකාව ගුරුවරයා වෙතින් ප්‍රදර්ශනය විය යුතුය. විෂයමාලා ප්‍රතිසංස්කරණය යටතේ ඉදිරිපත් කරනු ලබන මෙම විෂය මාලාව හා සම්බන්ධ ඉගෙනුම්- ඉගැන්වීම් ක්‍රමවේදය සංවර්ධනය කිරීමේ දී පරිණාමන ගුරු භූමිකාවට අමතර ව, සම්ප්‍රේෂණ හා ගනු දෙනු භූමිකාවන්හි ඇතුළත් වැදගත් ලක්ෂණ භාවිතයට ගැනීමට ද ගුරුභවතා සමත් විය යුතුය.

බුද්ධ ධර්මය විෂය මගින් ධර්මය ආත්මීකරණය කොට දැහැමි ක්‍රියාකාරකම් මාලාවක් ජීවිත උරුමයක් සේ සම්පාදනය කිරීම සඳහා ගුරු දායකත්වය මහෝපකාරී වේ. එහිදී ධර්මයට අනුගත ව ජීවත්වීමේ අවශ්‍යතාව ප්‍රකට ව සාකච්ඡා කෙරුණ ද, එය ජීවිත අත්දැකීමක් බවට පත්කර ගැනීම දකින්නට ලැබෙන්නේ අඩු ප්‍රතිශතයකිනි. ඒ නිසා පන්ති කාමරයේ ඉගැන්වෙන බුද්ධ ධර්මය විෂය අන්තර්ගතය, ඉන් බැහැර සමාජයේ දී ද සිය ජීවිතයට චරිතායනය කර ගැනීමට ශිෂ්‍ය ප්‍රජාවට මග පෙන්වීම අත්‍යවශ්‍ය ය. ඒ සඳහා යොමු විය හැකි ක්‍රමෝපායයන් කිහිපයක් මෙසේ දැක්විය හැකිය.

- නිවසේ ආගමික වත් පිළිවෙත්හි නිරත කරවීම.
- පාසලෙහි ආගමික වතාවත්වලට ක්‍රියාකාරී ව සහභාගිවීමට සැලැස්වීම.
- බෞද්ධ උත්සවයන්හි දී ආමිස පූජාවන්හි මෙන් ම ප්‍රතිපත්ති පූජාවෙහි වැඩි නැඹුරුවකින් නිරතවීමට විධිවිධාන යෙදීම.
- පාසල අයත් ප්‍රදේශයේ හෝ ශිෂ්‍යයා පදිංචි ප්‍රදේශයේ හෝ විහාරස්ථාන ඇසුරින් ආගමික කටයුතුවල නිරතවීමට මග පෙන්වීම.
- දහම් පාසල් අධ්‍යාපනයට නැඹුරු කරවීම.
- වැඩිහිටි නිවාස, රෝහල් ආදියේ උපස්ථාන කටයුතු හා ශ්‍රමදාන කටයුතුවලට යොමු කිරීම.

- පරිසරයේ වටිනාකම තේරුම් ගෙන ඒ අනුව කටයුතු කිරීමට සැලැස්වීම.
- සමාජ සුභසාධන ස්වේච්ඡා සමිති සමාගම්වලට සහභාගීවීමට හා ඒවායේ නිලතල දැරීමට උනන්දු කරවීම.

මේ ආදී ක්‍රමෝපායයන් මගින් පන්ති කාමරයේ ලබන ඉගෙනුම, ජීවිත අත්දැකීමක් බවට පත්කර ගැනීමට අවස්ථාව ලැබෙන අතර, එමගින් තහවුරු කර ගත හැකි සාරධර්ම චරිතායනය කර ගැනීමට අවස්ථාව සැලසේ. ඒ සඳහා ශිෂ්‍යයා යොමු කරවීම බුද්ධ ධර්මය විෂය උගන්වන ගුරු භවතාට පැවරෙන වැදගත් යුතුකමක් ද වේ.

- බෞද්ධ උත්සවයන්හි දී ආමිස පූජාවන්හි මෙන්ම ප්‍රතිපත්ති පූජාවෙහි වැඩි නැඹුරුවකින් නිරතවීමට විධිවිධාන යෙදීම.
- පාසල අයත් ප්‍රදේශයේ හෝ ශිෂ්‍යයා පදිංචි ප්‍රදේශයේ හෝ විහාරස්ථාන ඇසුරින් ආගමික කටයුතුවල නිරතවීමට මග පෙන්වීම.
- දහම් පාසල් අධ්‍යාපනයට නැඹුරු කරවීම.
- වැඩිහිටි නිවාස රෝහල් ආදියේ උපස්ථාන කටයුතු සහ ශ්‍රමදාන කටයුතුවලට යොමු කිරීම.

- පරිසරයේ වටිනාකම තේරුම් ගෙන ඒ අනුව කටයුතු කිරීමට සැලැස්වීම.
- සමාජ සුභසාධන ස්වේච්ඡා සමිති සමාගම්වලට සහභාගීවීමට හා ඒවායේ නිලතල දැරීමට උනන්දු කරවීම.

මේ ආදී ක්‍රමෝපායයන් මගින් පන්ති කාමරයේ ලබන ඉගෙනුම, ජීවිත අත්දැකීමක් බවට පත්කර ගැනීමට අවස්ථාව ලැබෙන අතර, එමගින් තහවුරු කරගත හැකි සාරධර්ම චරිතායනය කර ගැනීමට අවස්ථාව සැලසේ. ඒ සඳහා ශිෂ්‍යයා යොමු කරවීම බුද්ධ ධර්මය විෂය උගන්වන ගුරු භවතාට පැවරෙන වැදගත් යුතුකමක් ද වේ.


### පාසල් ප්‍රතිපත්ති හා වැඩ සටහන්

1. සෑම පුර පසළොස්වක පෝය දින හෝ එම පෝයට පෙර දින හෝ සුවිශේෂ වූ ආගමික උත්සව සංවිධානය කිරීම.
2. පාසලේ / විහාරස්ථානයේ ස්වාමීන් වහන්සේලාගේ අවවාද අනුශාසනා ආගමික කටයුතුවල දී ලබා ගැනීම.
3. ආගමික වතාවත් ඉටු කිරීමේ දී ශිෂ්‍යයන්ගේ හැකියා සඳහා ප්‍රමුඛත්වය ලබා දීම.
4. සහයෝගය, සාමූහිකත්වය, අන්‍යෝන්‍ය ගෞරවය සුහද බව තහවුරු වන පරිදි ප්‍රායෝගික ක්‍රියාකාරකම් සැලසුම් කිරීම.
5. බෞද්ධ ශිෂ්‍ය සමිති පිහිටුවීම සහ ඒ මගින් ආදර්ශවත් නායකත්වයක් පුහුණු කිරීම.
6. අධ්‍යාපන චාරිකා, පර්යේෂණ ව්‍යාපෘති, දැනුම මිනුම තරග, චිත්‍ර ප්‍රදර්ශන, බිත්ති පුවත්පත්, වාර ප්‍රකාශන ආදී ක්‍රියාකාරකම් මගින් වැඩසටහන් සංවිධානය කිරීම.
7. දෙමාපිය දැනුම්වත් කිරීම් තුළින් ශිෂ්‍ය හැකියා සංවර්ධනය කිරීම.

**තක්සේරුව හා ඇගයීම**

1. වාර අවසාන පරීක්ෂණ ඇසුරින් විෂය පිළිබඳ ශිෂ්‍ය සාධනයෙහි විධිමත් ඇගයීමක් අපේක්ෂා කෙරේ.
2. සෑම පාඩමකදී ම ශිෂ්‍යයන්ගේ සාධනය පිළිබඳ තක්සේරු කිරීමට/ඇගයීමට විෂය භාර ගුරු භවතා උනන්දුවීම අත්‍යවශ්‍ය ය.
3. ඇගයීම පිළිබඳ ලිඛිත වාර්තා, ලිපිගොනු පවත්වා ගැනීම ද අවශ්‍ය වේ.
4. ප්‍රතිපෝෂණ වැඩ සටහන් සැලසුම් කිරීම ද අපේක්ෂා කෙරේ.
5. ඉගෙනුම හා ඉගැන්වීම දීර්ඝ කිරීම සඳහා ගුරු භවතාට යොදා ගත හැකි අවස්ථා කිහිපයක් පහත දැක්වේ.
   - සංකල්ප සිතියම්, බිත්ති පුවත්පත්, ප්‍රශ්න විචාරාත්මක වැඩ සටහන්
   - ප්‍රශ්න සහ පිළිතුරු පොත්, ශිෂ්‍ය කාර්ය සාධන ගොනු, සිසු නිර්මාණ
   - ප්‍රදර්ශන, විවාද සාකච්ඡා මණ්ඩල, සම්මන්ත්‍රණ, ක්ෂණික කථා
   - භූමිකා රංගන, සාහිත්‍ය විමසුම් ඉදිරිපත් කිරීම, ක්ෂේත්‍ර පොත්
   - ස්වභාව අධ්‍යයන දින පොත්, හොඳ වැඩ පොත්, ප්‍රායෝගික පරීක්ෂණ

**විවිධ සහය**

**කාර්යාලීය කටයුතු** : එස්. සී. ප්‍රියදර්ශනී මහත්මිය, ජාතික අධ්‍යාපන ආයතනය

ඩයස් අමරසිංහ මහතා, ජාතික අධ්‍යාපන ආයතනය

ගාමිණී රෝහණ විමලසේන මහතා, ජාතික අධ්‍යාපන ආයතනය